ක්‍රිස්තුස් වහන්සේගේ

# පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"සිහියෙන් යුක්තවද, ධර්මිෂ්ඨ ලෙසද, භක්තිවන්ත ලෙසද, මේ ලෝකයෙහි ජීවත්වන ජිනිස ඒ කරුණාව අප දැනුමැති කරන්නේය." (තීතස් 3:13)

82 වන වෙළුම අංක 04 (970) 2023 ජූලි / අගෝස්තු මාස

# ඔබේ ස්වාමීන් වහන්සේ පැමිණෙන්.. එබැවින් බලාසිටින්න

ශුද්ධාත්මයාණන් වහන්සේ පුරාණයේ සිටි ශුද්ධ වූ මනුෂ්‍යයන්ට ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම ගැන ලියන්නට පූර්ණ ලෙස දේවානුභාවය ලබා දුන් සේක. අළුත් ගිවිසුමෙන් 1/25 කට ආසන්න ප්‍රමාණයක් විදුම්කාරවාණන්ගේ නැවත පැමිණීම සම්බන්ධව කාරුණු දක්වයි. සෝදිසියෙන් සිටීමේ සහ සූදානම්ව සිටීමේ වැදගත්කම අවධාරණය කිරීමට යේසුස් වහන්සේ කැමති වූ විට උන්වහන්සේ තම අවවාද වේගවත් අකුණු සැර සමඟ සම්බන්ධ කළ සේක. අපෝස්තුළුවරුන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට හැරැණා වූ අයව පසුතැවිලිවීම, සන්සුන්කම, සත්‍යවාදී බව, ශුද්ධකම, හදවතේ පවිත්‍රත්වය, සහෝදර ප්‍රේමය, ශුද්ධව සංවාදයේ යෙදීම පදනම් කරගන්නේ ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණීමේ ශ්‍රේෂ්ඨ සත්‍යතාවය මතය. දෙවන පැමිණීමට වඩා හැසිරීම් ශුද්ධකම බලගැන්වීම සඳහා බයිබලයේ කිසිදු මූලධර්මයක් භාවිතා නොවේ.

**සෝදිසියෙන් සිටීම :-** "එබැවින් අවදිව සිටපල්ලා. මක්නිසාද නුඹලාගේ ස්වාමියා කොයි දවසේ එනසේක්දැයි නුඹලා දන්නේ නැත. නුවුත් සොරා කොයි යාමයේ එන්නේදැයි ගෙයි ස්වාමියා දැන සිටියේ නම් ඔහු අවදිව සිටිවින් තමාගේ ගෙය උවංකඹින්ට නොදෙන බව දැනගනිල්ලා. එබැවින් නුඹලාත් සැදී සිටපල්ලා. මක්නිසාද නුඹලා නොසිතන පැයකදී මනුෂ්‍යය පුත්‍රයා එන සේක." (මතෙව් 24 : 42-44)

**සන්සුන්කම :-** "මක්නිසාද රාත්‍රියෙහි සොරෙකු එන්නාක් මෙන් ස්වාමීන් වහන්සේගේ දවස පැමිණෙන බව නුඹලාම හොඳ හැටි දනිහුය." (1 තෙසලෝනික 5:2) "එබැවින් වෙන තැනැත්තන් මෙන් අපි නිදා නොගෙන මත්නොවී සිටිමු." (1 තෙසලෝනික 5 :6) " ඉන්නිසා නුඹලාගේ සිත් නැවති කටි බැඳගෙන සිහි ඇතුව සිට යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ එළිදරව්වීමේදී නුඹලා වෙතට පවුණුවනු ලබන්ට තිබෙන අනුග්‍රහය පිට නුඹලාගේ බලාපොරොත්තුව සම්පූර්ණ ලෙස පිහිටුවාපල්ලා" (ප්‍රේත්‍රුස් 1 :13)

**පසුතැවිලිවීම :-** "එබැවින් ස්වාමීන් වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයන් පැමිණෙන ලෙසද නුඹලා උදෙසා නියමකරන ලද්දාවූ ක්‍රිස්තුස් වහන්සේ එනම් යේසුස් වහන්සේ එවන පිණිසද නුඹලාගේ පාපයන් මකා දමනු ලබන පිණිසද පශ්චාත්තාපව හැරියල්ලා. දෙවියන් වහන්සේ ලෝකයේ පටන් ගැන්වේ සිට තමන්ගේ ශුද්ධ වූ අනාගතවක්තෘන්ගේ මුඛයෙන් කියෙවිවාවූ සියලු දේ නැවත පිහිටුවන්නාවූ කාලවල් දක්වා උන්වහන්සේ ස්වර්ගයෙහි සිටින්ට ඕනෑය." (ක්‍රියා 3:19-21)

**විශ්වාසවන්තකම :-** "බොහෝ කලකට පසු ඒ දාසයන්ගේ ස්වාමියා ඇවිත් ඔවුන් සමඟ ගණන් බැලුවේය. එවිට තලෙන්ත පහ ලැබූ තැනැත්තේ තවත් තලෙන්ත පහක් ගෙනැවිත් ස්වාමීනී, ඔබ මට තලෙන්ත පහක් භාරදුන්නෙහිය. මෙන්න තවත් තලෙන්ත පහක් උපදවා ගතිමියි කවේය. ඔහුගේ ස්වාමියා ඔහුට කථාකොට යහපත් වූ විශ්වාස වූ දාසය ඒ යහපත ස්වල්ප දේ ගැන නුඹ විශ්වාස වූවෙහිය. බොහෝ දේ කෙරෙහි නුඹ අධිපති කරමි. නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වෙයන්යැයි ඔහුට කීවේය." (මතෙව් 25:19-21)

**යේසුස් වහන්සේ ගැන ලැජ්ජා නොවීම :-** "එසේ හෙයින් මේ කාමව්‍යභිචාරික වූ, පාපිෂ්ඨ වූ පරම්පරාවේදී යමෙක් මා ගැනත්, මාගේ වචන ගැනත් ලැජ්ජාවන්නේද මනුෂ්‍ය පුත්‍රයා තමන් පියාණන්ගේ තේජසින් ශුද්ධ දේවදූතයන් සමඟ එන කළ උන්වහන්සේ ඔහු ගැනත් ලැජ්ජා වෙන්වා ඇතැයි කී සේක." (මාර්ක් 8:38)

**වෙනත් ලෞකිකත්වයන් මත නොසිටීම :-** "යම් මනුෂ්‍යයෙක් ලුළු ලෝකය ලබාගත්තත් තමාගේ ජීවිතය නැති වුණොත් ඔහුට මොන ලාභයක්ද ... ? නොහොත් මනුෂ්‍යයෙක් තමාගේ ජීවිතය වෙනුවට දෙන්නේ කුමක්ද ... ? මක්නිසාද මනුෂ්‍යය පුත්‍රයා තමන් පියාණන් වහන්සේගේ තේජසින් යුක්තව තමන් දූතයන් සමඟ එන්නේය. එකල උන්වහන්සේ එකිනෙකාට තම තමාගේ ක්‍රියා ලෙස විපාක දෙන සේක." (මතෙව් 16:26-27)

**මධ්‍යස්ථභාවය :-** "නුඹලාගේ ඉවසිලිවන්තකම සියලු මනුෂ්‍යයන්ට දැනගන්ට ලැබේවා. ස්වාමීන් වහන්සේ ළංවං සිටින සේක." (පිලිප්පි 4:5)

**මාංශයෙන් කාමුක ආශා නැසීම :-** "අපේ ජීවනය වන ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශවන කළ නුඹලාත් උන්වහන්සේ සමඟ තේජසින් ප්‍රකාශවන්නහුය. එබැවින් පොළොවේ තිබන නුඹලාගේ අවයවයන් එනම් වෛශ්‍යාකමත්, අපිරිසිදුකමත්, කාමරාගයත් , නපුරු තෘෂ්ණාවත්, රූප වැඳීම වූ තෘෂ්ණාවත් නසාපල්ලා" (කොලොස්සි 3:4-5)

**අවංකකම :-** "උතුම් වූ දේවල් ඒත්තුගන්ට නුඹලාට පුළුවන් වෙන්ටත් ක්‍රිස්තුස් වහන්සේගේ දවස දක්වා අවංකව, නිදොස්ව සිටින්ටත්, නුඹලාගේ ප්‍රේමය දැනගැන්මෙන් හා සියලු ආකාර විවසීමෙන් තව වඩ වඩා බොහෝ වන පිණිස යාච්ඤා කරමි." (පිලිප්පි 1:10-11)

ඩී.ඩබ්. මිලර් සහ ජී.එන්. ඕවන් විසිනි.

**විශුද්ධ කිරීම සහ ශුද්ධ වූ ජීවිතය :-** "සමාදානයේ දෙවියන් වහන්සේම නුඹලා සහමුලින්ම පවිත්‍ර කරන සේක්වා. නුඹලාගේ මුළු ආත්මයත්, ප්‍රාණයත්, ශරීරයත් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඊවේදී නිදොස්ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේවා." (1 තෙසලෝනික 5:23)

**සේවයේ විශ්වාසවන්තකම :-** "දෙවියන් වහන්සේ ඉදිරියෙහි ද ජීවත්ව සිටින්නන් සහ මළවුන්ද විනිශ්චය කරන්ට සිටින ක්‍රිස්තුස් යේසුස් වහන්සේ ඉදිරියෙහිද, උන්වහන්සේගේ ප්‍රකාශවීම හා උන්වහන්සේගේ රාජ්‍යයේ නාමයෙන් මා විසින් නුඹට අණකරන්නේ නම්, වචනය දේශනා කරපන්න. කලටත්, අකලටත් වැඩේ යෙදී සිටපන්න. සියලු ආකාර ඉවසිලිවන්තකමෙන් සහ ඉගැන්වීමෙන් තරවටු කර, අවවාද කර, අනුශාසනා කරපන්න කියායි." (2 තිමෝති 4:1-2)

**ආඥා පිළිපැදීම :-** "අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රකාශවීම දක්වා නුඹ වේ ආඥාව කැළලක්ද, දෝෂයක් ද නැතුව පවත්වන ලෙස සියල්ල ජීවත්කරන්නාවූ දෙවියන් වහන්සේද, පොන්තියුස් පිලාත් ඉදිරියෙහි යහපත් ප්‍රකාශනය කළා වූ ක්‍රිස්තුස් යේසුස් වහන්සේද ඉදිරියෙහි නුඹට ආඥා කරමි. ( 1 තිමෝති 6:13-14)

**එඩේරෙක් ලෙස උත්සහවන්තකම :-** " නුඹලා අතරෙහි සිටින දෙවියන් වහන්සේගේ රැළ බලාගනිමින් බලහත්කාරය නිසා නොව, දේව කැමත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද නුඹලාගේ භාරයට දෙන ලද්දවුන් කෙරෙහි අධිපතිකම් කරන්නාක් මෙන් නොව නුඹලාව රැළට ආදර්ශව සිටිමින්ද එය රැකබලාගෙ නිල්ලා." (1 ප්‍රේත්‍රුස් 5:2-3)

**පිරිසිදුකම :- "පවිත්‍රත්වය :-** ප්‍රේමවන්තයෙනි, දැන් අපි දෙවියන් වහන්සේගේ දරුවෝය. අපි කොයි ආකාර අය වන්නෙමුදැයි තවම ප්‍රකාශ වී නැත. උන්වහන්සේ ප්‍රකාශ වුනාම අපි උන්වහන්සේට සමාන වන බව දනිමුව. මක්නිසාද උන්වහන්සේ සිටින ආකාරයටම අපි උන්වහන්සේ දකින්නෙමුව. උන්වහන්සේ කෙරෙහි මේ බලාපොරොත්තුව තබා සිටින සැම දෙනම උන්වහන්සේ පිරිසිදුව සිටින්නාක් මෙන්ම තමන්ම පිරිසිදු කර ගනිති."
(1 යොහාන් 3:2-3)

2 පිටුවට

1 පිටුවෙන්

# ඔබේ ස්වාමීන් වහන්සේ පැමිණේ..

**ක්‍රිස්තුස් වහන්සේ තුළ වාසය කිරීම :-** ඉතින් මාගේ ප්‍රිය දරුවෙනි, උන්වහන්සේ තුළ පැවතියල්ලා. එසේ කළ යුතු වන්නේ උන්වහන්සේ ප්‍රකාශ වුනාම උන්වහන්සේගේ පැමිණීමේදී අප උන්වහන්සේගේ ඉදිරිපිට ලැජ්ජා නොවී නිර්භීතකම ඇතුව සිටින පිණිසය." (1 යොහාන් 2:28)

**ඇදහිල්ලේ සෝදිසි කිරීම් සහ පරීක්ෂාවන් ඉවසා දරා ගැනීම :-** " එසේ ශෝකයට පත්වන්නේ නාස්තිවී යන්නා වූ එසේද වුවත් ගින්නෙන් සෝදිසි කරන්නා වූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ ඇදහිල්ල පරීක්ෂා කිරීමෙන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ එළිදරවිවීමේදී ප්‍රශංසාවත්, මහිමයත්, ගෞරවයත් පැවිණෙන පිණිසය." ( 1 පේත්‍රුස් 1:7)

**ශුද්ධ වූ සංවාදය :-** "යමෙක් කථා කෙරේ නම් දෙවියන් වහන්සේගේ වාක්‍ය වශයෙන් කතා කරාවා. යමෙක් සේවය කෙරේ නම්, දෙවියන් වහන්සේ සපයා දෙන ශක්තියේ ප්‍රකාර සේවය කරාවා. දෙවියන් වහන්සේට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණු කොටගෙන සියලු කාරණාවලදී ගෞරව පැවිණෙන පිණිස එසේ කරන්ට ඕනෑය. මහිමයත්, පරාක්‍රමයත් සදාකාලේටම උන්වහන්සේගේය. ආමේන්, ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැවිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිදුවන්නාක් මෙන් පුදුම නොවෙල්ලා. නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ තේජසේ එළිදරවිවීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක්විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා."
(1 පේත්‍රුස් 4:11-13)

**සහෝදර ප්‍රේමය :-** අප නුඹලාට ප්‍රේම කරන්නාක් මෙන්ම ස්වාමීන් වහන්සේ නුඹළාගෙන් එකිනෙකා කෙරෙහිත් අනික් සියල්ලන් කෙරෙහිත් නුඹලාගේ ප්‍රේමය වැඩිකර එයින් නුඹලා පුරවා මෙසේ අපගේ ස්වාමී වූ යේසුස් වහන්සේ තමන්ගේ සියලු ශුද්ධවන්තයන් සමඟ එන කළ නුඹළාගේ සිත් අපගේ පියවූ දෙවියන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධකමින් නිදොස්ව තිබෙන්ට ස්ථිර කරන සේක්වා."
(1 තෙසලෝනික 3:12-13)

**ඇදහිල්ලේ සටන තුළ සටන් කිරීම :-** "මම යහපත් යුද්ධයෙහි ශුද්ධ කළෙමි. මම දිවීම කෙළවර කළෙමි. මම ඇදහිල්ල රක්ෂා කළෙමි. මෙතැන් පටන් ධර්මිෂ්ඨකමේ ඔටුන්න මට තබා තිබේ. එය ධර්මිෂ්ඨ විනිශ්චයකාර වූ ස්වාමීන් වහන්සේ ඒ දවසේදී මට දෙනවා ඇත. මට පමණක් නොවේ. උන්වහන්සේගේ ප්‍රකාශවීමට ආශාව සිටින සියල්ලන්ටද දෙනවා ඇත." (2 තිමෝති 4:7-8)

**ඔබගේ ඔටුන්න රැකගන්න :-** "කිසිවෙක් නුඹේ ඔටුන්න නොගන්නා ලෙස නුඹට තිබෙන දේ තදින් අල්ලා ගනින්න." (එළිදරව් 3:11)

**අභක්තිකකම ප්‍රතික්ෂේප කර භක්තිවන්තකම තුළ ජීවත්වීම :-** " අභක්තිකකමද, ලෞකික තෘෂ්ණාද ඵපාකර ආශීර්වාදලන් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන් වහන්සේගේ ද, අපගේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේද තේජසේ ප්‍රකාශවීම ගැනත් බලා සිටිමින් සිහියෙන් යුක්තවද, ධර්මිෂ්ඨ ලෙසද, භක්තිවන්ත ලෙසද මේ ලෝකයෙහි ජීවත්වන පිණිස ඒ කරුණාව අප දැනුවැති කරන්නේය." (තීතස් 2:12-13)

**හදිසිසියෙන් පැමිණීම ගැන සෝදිසියෙන් සිටීම :-** "මක්නිසා ද ආකාශයේ එක් දිසාවකින් නික්මෙන විදුලිය ආකාශයේ අනික් දිසාව දක්වා බැබලෙන්නාක් මෙන් මනුෂ්‍ය පුත්‍රයා තමන් දවසේදී වන්නේය." (ලූක් 17:24)

*** විනිශ්චය නොකරන්න :-** "එහෙයින් ස්වාමීන් වහන්සේ එනතුරු කාලයට පළවුවෙන් කිසිවෙක් විනිශ්චය නොකරල්ලා. උන්වහන්සේ අන්ධකාරයේ සැඟවුණු දේ එළිදරවිකොට සිත්වල අදහස් ප්‍රකාශ කරන සේක. එවිට එකිනෙකාට තම තමාගේ ප්‍රශංසාව දෙවියන් වහන්සේගෙන් ලැබෙන්නේය." (1 කොරින්ති 4:5)

**ප්‍රීතිමත් කාලයක් සඳහා සහතිකය :-** " මෙසේ වම නිශ්චල ලෙස නොදිවීවි. නිශ්චල ලෙස වීර්යය නොකළෙවියි කියා ක්‍රිස්තුස් වහන්සේගේ දවසේදී මට පාරිට්ටුවක් ඇතිවන්නේය." (පිලිප්පි 2:16)

**උන්වහන්සේගේ පිටත්ව යාමෙන් සැනසීම :-** "මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරවි නම් මා සිටින තැන නුඹළාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙවි." (යොහාන් 14:3)

**අපි බලා සිටිය යුතු කාරණය :-** "පැවිණෙන උදහසින් අප ගලවන්නා වූ තමන්ගේ පුත්‍ර වූ යේසුස් වහන්සේ ස්වර්ගයෙන් එනවා බලා සිටින පිණිසද නුඹලා දේවතාරූප කෙරෙන් දෙවියන් වහන්සේ වෙතට හැරුණ හැටිත් ඔවුහුම දන්වති'
(1 තෙසලෝනික" 1:10)

**විනිශ්චයේ කාලය :-** "මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් සමඟ තමන්ගේ තේජසින් එන කළ ස්වකීය තේජසේ සිංහාසනයෙහි වැඩ හිඳින සේක. එවිට සියලු ජාතීහු උන්වහන්සේ ඉදිරියට රැස් කරනු ලබන්නෝය. උන්වහන්සේ එඩේරෙකු විසින් එළුවන් කෙරෙන් බැටුවන් වෙන් කරන්නාක් මෙන් ඔවුන් වෙන්කොට බැටළුවන් තමන්ගේ දකුණු පැත්තේද, එළුවන් වම් පැත්තේද සිටුවන සේක." (මතෙව් 25:31-33)

**ශුද්ධවන්තයන් නැවත නැගිටීම :-** මක්නිසාද ආදව් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම ක්‍රිස්තුස් වහන්සේ තුළ සියල්ලෝම ජීවත්කරනු ලබන්නෝය. නුමුත් එක් එක් අය තම තමාගෙ 'ම ක්‍රමයෙන්ය. ක්‍රිස්තුස් වහන්සේ නැඹුල් වලයය. ඉන්පසු ක්‍රිස්තුස් වහන්සේගේ ඊවේදී උන්වහන්සේ සන්තක වූවෝ (නැගිටින්නෝය) එවිට කෙළවර පැවිණේ." (1 කොරින්ති 15, 22 - 23)

**ශුද්ධවන්තයන්ගේ ප්‍රකාශවීම :-** අපේ ජීවනය වන ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශවන කළ නුඹලාත් උන්වහන්සේ සමඟ තේජසින් ප්‍රකාශ වන්නහුය." (කොලොස්සි 3:4)

**ක්‍රිස්තුස් වහන්සේ මැරුණාවූ අය උදෙසා සැනසිල්ල :-** තවද සහෝදරයෙනි, බලාපොරොත්තුවක් නැත්තා වූ අන් නැනැත්තන් මෙන් නුඹලා සෝක නොවන පිණිස සැතපෙන්නන් ගැන නුඹලා නොදන සිටිනාවට අපි නොකැමැත්තෙමුව. මක්නිසාද යේසුස් වහන්සේ මැරී නැවත නැගිටුණු සේකැයි අප අදහමු නම්, එසේම දෙවියන් වහන්සේ, යේසුස් වහන්සේ කරුණුකොටගෙන සැතපී සිටින්නන් උන්වහන්සේ සමඟ ගෙනෙන සේක. මක්නිසාද ස්වාමීන් වහන්සේගේ ඊම දක්වා ජීවත්ව ඉතුරුවෙන අපි සැතපුණු නැනැත්තන්ට කිසිසේත් ඉස්සර නොවන්නෙමු යයි ස්වාමීන් වහන්සේගේ වචනයෙන් අපි නුඹලාට කියමුව. මක්නිසාද ස්වාමීන් වහන්සේම මහත් ශබ්දයක් ද උත්තම දේවදූතයෙකුගේ හඬද, දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ද ඇතුව ස්වර්ගයෙන් බස්නාසේක. ක්‍රිස්තුස් වහන්සේ තුළ මලා වූ අය පළවුකොට නැගිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමඟ සවිඋඩවන පිණිස වළාකුළ් වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමීන් වහන්සේ සමඟ සිටින්නෙමු. ඉන්නිසා මේ වචන වලින් එකිනෙකා සනසා ගනිල්ලා. " (1 තෙසලෝනික 4:13-18)

**නොඇදහිලිවන්තයන්ගේ පිඩා කාලය :-** කුවක් හෙයින්ද ස්වාමිවූ යෙසුස් වහන්සේ තමන්ගේ පරාක්‍රමයේ දූතයන් සමඟ අවිලෙන්නා වූ ගින්නෙන් යුක්තව ස්වර්ගයෙන් එළිදරවිවී දෙවියන් වහන්සේ නාදුනන්නනටත්, අපගේ ස්වාමී වූ යේසුස් වහන්සේගේ ශුභාරංචියට කීකරු නොවන්නන්ටත් ප්‍රතිවල දෙන කළ නුඹලාට දුක් දෙන්නන්ට දුකද, දුක්විඳින නුඹලාට අප සමඟ සහනය ද දීව දෙවියන් වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ වූ කාරණාක්ය."
(2 තෙසලෝනික 1:6-8)

**ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය සමඟ ප්‍රකාශ කර ඇත. :-**"මක්නිසාද නුඹලා යම් පවණ වරක් මේ රොටි කන්නහුද කුසලානෙන්, බොන්නහුද එපමණවරක් ස්වාමීන් වහන්සේ එනතුරු නුඹලා උන්වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහුය."
(1 කොරින්ති 11:26)

සෑම දේවස්ථානයකම දේව සේවයේ, කිතුණු ඇදහිල්ලේ සහ ශුද්ධ වූ ජීවිතයේ සියලු වූලික කරුණු සමඟ ඉතා සංකීර්ණ ලෙස බැඳී ඇති ගැඹුරු භක්තියේ සහ අධ්‍යාත්මිකත්වයේ ප්‍රධාන හරය වන මෙවැනි අත්‍යාවශ්‍යය ආත්මය ස්පර්ශ කරන පණිවිඩ දේශනා කළ යුතුය.

**මංගල්‍ය වස්ත්‍ර වලින් සැරසී ඇත.**

යේසුස් වහන්සේ සහ ප්‍රේරිතයන් බොහෝ ප්‍රායෝගික අවවාද බලාත්මක කිරීමට දෙවන පැවිණීම භාවිතා කළහ. අපි මංගල්‍යය වස්ත්‍ර වලින් සැරසී බලා සිටිමු. දුෂිත සහ පවිකාර මනුෂ්‍යයන් ඉදිරියේ අපි උන්වන්සේව පිළිගත යුතුය. අපි විශ්වාසවන්තව සිටිය යුතුය. අපි සම්පූර්ණයෙන්ම පසුතැවිලි විය යුතුය. ලෞකිකත්වයේ රැල්ල නැවැත්විය යුතුය. මධ්‍යස්ථව සහ ඉවසිලිවන්තව කටයුතු කරන ලෙස අපට අවවාද කර ඇත. කුණුවෙන්නා වූ මාංශයේ කාමවිත්‍යාවාරික වේ වර්මාන ලෝකයේ අපි අවංකව, දේවභක්තිකව සහ ධර්මිෂ්ඨව ජීවත්විය යුතුය. අපට ආඥාකාර ඇත්තේ ශුද්ධව, දොස්පැවරිය නොහැකි, නිදොස් සහ අවංකවීමටයි. ක්‍රිස්තුස් වහන්සේ නිසා ආඥාවලට කීකරුවෙන ලෙස අපට දැනවුතුකවිදී තිබේ.

අභ්‍යන්තර සටන් වලින් ඉරා දැමූ අපගේ හදවත් ශුද්ධකමේ පිහිටුවිය යුතුය. අපි සන්සුන් විය යුතු අතර දෙවියන් වහන්සේගේ කරුණාව මත අපගේ බලාපොරොත්තුව තබා අපගේ සංවාදයේ දී දේව භක්තික විය යුතුය. විදිවැලේ අතුවෙන් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධවී සිටින ලෙස අපට අවවාද කර ඇත. අපගේ ජීවිත ක්‍රිස්තුස් වහන්සේ තුළ සඟවාගෙන නපුරේ අපවිත්‍රකමෙන් ආරක්ෂා කරගෙන පවිත්‍රව සිටිය යුතුය.

යහපත් සොල්දාදුවෙක් මෙන් අපට පැවිණෙන ගිනිමය පීඩාවන් සහ පරීක්ෂාවන්

3 පිටුවට

2 පිටුවෙන්

# ඔබේ ස්වාමීන් වහන්සේ පැමිණේ..

ඇදහිල්ලේ පදනම වන සිට දර්ශන යුතුය. ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමින් සහෝදර ප්‍රේමය වැඩිකරගත යුතුය. අපි අපගේ පිරිසිදු මනස ස්වර්ගීය පුරවැසිභාවය මත තබාගත යුතුය. විලේචිත ද්‍රව්‍යවාදය පවතින ලෝකයක ජීවත්වන අපි ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම සොයමින් ඊට ප්‍රේමකල යුතුය. උන්වහන්සේගේ පැමිණීම ළංව තිබෙන බැවින් අපි බලා සිටිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේගේ බලය කෙරෙහි සූර්ෂ විශ්වාසය තබා ගැනීමට අපට අවවාද කරනු ලැබේ. ප්‍රේමයේ සේවකයන් ලෙස අපි අපගේ බලාපොරොත්තුව තදින් අල්ලාගෙන ක්‍රිස්තුස් වහන්සේගේ රැධිරයන් විලේපගත් කිරළඳු කිසිවෙකුට ගැනීමට ඉඩ නොදිය යුතුය. දෙවියන් වහන්සේ විසින් ගොඩනගා ඉදිකර තිබෙන ඉහළින් පැවිණෙන්නා වූ රාජ්‍ය අපි බලා සිටිමු. ආත්මය ලෝකයේ තිබෙන කාමයෙන් නොපැටලෙන පිණිස පාපිෂ්ඨ ක්‍රියාකාරකම් වලින්, කාමමිත්‍යාචාරික උයනේ වල්වල මාරාන්තික සුවඳින් වෙන්ව සිටිමු. එවිට විනිශ්චයෙන් ආරක්ෂාවීමට හැකිවේ. මක්නිසාද යේසුස් වහන්සේ උන්වහන්සේගේ ශුද්ධ වූ දේවදූතයන් සමඟ එන සේක.

## සටන් කිරීම, සේවය සහ ප්‍රේමය

ලෞකික දිළිඳුකම තුළ කුඩාරමක හෝ දුප්පත් ගෘහයක සිටින අපි රජුන්ගේ රජතුමාගේ විපාකය බලාපොරොත්තුවෙන් සිටින්නෙමු. අවර්ණනීයත්වයට පත්කරන ලද ශරීරයක් සමඟ අප නැවත නැගිටුවනු ලැබීමේ සිතුවිල්ලෙන් සැනසීම ලබාගන්නෙමු. කල්වාරියේ සිට විදීවේ ක්‍රියාවලිය තුළ සෝදාගත් වස්ත්‍ර සමඟ දෙවියන් වහන්සේගේ පුත්‍රයන් ලෙස දිවසවය ඔසවා ගැනීමට සූදානම්ව සිටින ලෙස අපට ප්‍රකාශ කර තිබෙන සේක. දීප්තිමත්ව බලයෙන් බැබලීමට ප්‍රේමයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ ගැඹුරු කාරණාවල බහුලවන පිණිස අනුශාසනා කර ඇත. ස්වර්ගය දෙස බැලීමට ධර්මිෂ්ඨකමේ සූර්යයාගේ බැබලීම දැකීමට ස්වාමීන් වහන්සේ රාත්‍රියේ සොරෙකු මෙන් පැමිණෙන බැවින් බලාපොරොත්තුව ඇතිව ඇදහිල්ලේ කඹුව ගෙන සටන් කරමින් වෙහෙස මහන්සිවී ප්‍රේම කළ යුතුය.

අපි එය දේශනා කරමු. අපගේ පණිවිඩය සත්‍යතාවයේ පර්වතයක් වේවා. අපගේ ගීතිකාවලින් උන්වහන්සේගේ පැමිණීමේ පෙරමඟ දිවසවය ක්‍රියාවලියන් විහිරී නාදයෙන් පිරී යෙත්වා.... උන්වහන්සේ එනවා බලාසිටින්න.

# මේ අන්තිම දවස්වලදී සැලකිල්ලෙන් සහ සෝදිසියෙන් බලාසිටින්න

(රිව් කාර්මයිකල් විසිනි.)

**"නුවුන් සියලු දේවල අන්තිමය ළංව තිබේ. එබැවින් නුඹලා සිහියෙන් යුක්තව සිට යාච්ඤා කිරීම පිණිස පිඹිද සිටපල්ලා."** (1 පේත්‍රැස් 4:7)

මෙය නිසැකවම බැරෑරුම්ව සහ යාච්ඤාවෙන් බලාසිටිය යුතු පැයකි. ස්වාමීන් වහන්සේගේ නැවත පැමිණීම ළංව පවතින අවසාන දින කිහිපය තුළ අප සිටින බව කාලවල ලකුණු වලින් පැහැදිලි වේ. **"මක්නිසාද ජාතියක් ජාතියකටද, රාජ්‍යයක් රාජ්‍යයකට ද, විරුද්ධව නැගිටිනවා ඇත. නොයෙක් තැන්වල සාගතද, පොලෝ කම්පාද සිදුවෙනවා ඇත. මේ සියල්ල වනාහී ගැබිනාවල පටන් ගැන්මය."** (මතෙව් 24:7-8) **උන්වහන්සේ වැඩි වැඩියෙන් පීඩා, වෛරය, රැවටීම, අවනීතිය ගැන අනතුරු ඇඟවූ සේක. බොහෝ දෙනාගේ ප්‍රේමය හීනවී යයි.** (මතෙව් 24: 9-12)

**ඇත්ත වශයෙන්ම මෙම ලකුණු අපේ කාලයේ ජාත්‍යන්තර ආතතියන්, යුද්ධ සම්බන්ධ තත්ත්වය සමඟ අත්වැල් බැඳගනියි. දැනට පවතින රැසියා, යුක්‍රේන යුද්ධය ඉදිරියට යනවා පමණක් නොව චීනය, තායිවානය ආක්‍රමණය කරනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. ලෝකයටම ඇතිකරන බලපෑම්ද පවතියි. ඉරානය නෂ්ඨික හැකියාවන් හඹායන විට ඊශ්‍රායෙලයට සහ ලෝකයට නුදුරු අනාගතයේ දී කුමක් විය හැකිද ...? එක් ප්‍රවෘත්ති වූලාඝ්‍රයක් වැනකදී පෙන්වා දුන් පරිදි ඊශ්‍රායෙලය සිය විශාලතම සතුරා ලෙස ඉරානය සලකන අතර ඊශ්‍රායෙල් අග්‍රාමාත්‍ය බෙන්ජමින් නෙතන්යාහු ඉරානයට නෂ්ඨික අවියක් නිපදවීමට ඉඩ නොදෙන බව නැවත, නැවතත් ප්‍රකාශ කළ බවයි.**

**ඒ අනර්ථ විලියන ගණන් ජනතාව සාගත, නියඟ, වසංගත, භූමිකම්පා සහ වෙනත් ස්වභාවික විපත් නිසා දුක්විඳින ආකාරයන් සිතා බලන්න. මෙවැනි සිදුවීම් සංඛ්‍යාත්මකව සහ තීව්‍රතාවයෙන් අනිශයින් වැඩිවෙමින් පවතියි. දශක කිහිපයකට පෙරදී පවා සදාචාරාත්මක වටිනාකම් කොපමණ සීඝ්‍රයෙන් පිරිහී යනු අද්දැයි අපට සිතාගත හැකි වූවාද .... ? වෛරය, රැවටීම, අවනීතිය සහ දුරාචාරය අපගේ කාලයේ ලක්ෂණ වේ. "ග්‍රෙනක්ලීන් ග්‍රැව්" වැනකදී බෙදාගත් පරිදි ලෝකය ඉතා ඉක්මනින් පිරිහෙමින් පවතී. නිරයේ සිටින සෑම යක්ෂයෙක්ම ලිහිල් කර තිබෙන්නාක් මෙන් හැඟීමක් ඇතිව තිබේ. කුණාටුවක් පැවිණෙන බව උන්වහන්සේ ප්‍රකාශ කරන අතර අනතුරු අඟවයි. අපව රැවටීමට පෙර අනුවණ බවට පත්කළ නොහැකිය. අපි සූදානම්වී පිළියෙල විය යුතුය.**

**කණස්සල්ලට තවත් හේතුවක් වන්නේ කෘතිම බුද්ධිය වන ඒ අයි. තාක්ෂණය සීඝ්‍ර ලෙස වර්ධනයවීමයි. මෙම ප්‍රබල තාක්ෂණය ධනාත්මක ප්‍රතිලාභ පොරොන්දු වන අතර එහි අන්තරායේ සම්පූර්ණ තත්ත්වය දන්නේ කවුද ..?**

## මෙම කාරණා (ගැටලු) පිළිබඳව

මෙවැනි සංවේදී ප්‍රශ්න සහ යතාර්ථයන් මනාසේ හදුනාගෙන කටයුතු කිරීමට පෙරමඟ දූතයා මෙම කලාපය ඔබට අභියෝගයක් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. එය ඔබව ඉදිරි දින සඳහා සූදානම්වීමට දිරි ගන්වමින් උනන්දු කරනු ලබයි. දේවභක්තික ජීවිතයක් ගතිකිරීමේ අවශ්‍යතාවය ඇතුළුව ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම සඳහා සූදානම්වීමේ වැදගත්කම එක් තේමාවකි. අපෝස්තුළු පාවුල් අනුශාසනා කරන පරිදි ඒ කරුණාව අප දැනුමැතිකරන්නේය. **"අභක්තිකකමද, ලෞකික තෘෂ්ණාද එපාකර ආශීර්වාදලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන් වහන්සේද, අපගේ ද ගැලවුවිකාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ද, තේජසේ ප්‍රකාශවීම ගැනත් බලා සිටිමින්, සිහියෙන් යුක්තවද ධර්මිෂ්ඨ ලෙසද, භක්තිවන්ත ලෙසද, මේ ලෝකයෙහි ජීවත්වන පිණිස ඒ කරුණාව අප දැනුවැති කරන්නේය."** (තීතස් 2:12-13)

**"ජෝර්ජ් ජී. වොට්සන්" විසින් ලියන ලද "ස්වාමීන් වහන්සේ "** උදෙසා ඔබගේ සිත අලුත්කරගන්න සහ "නිදැල්ලේ යන හදවත" යන ලිපි දෙක වෙත මම ඔබේ අවධානය යොමු කරන්නෙමි. මේ සමඟ ඇති පණිවිඩවල තවත් ප්‍රධාන තේමාවක් වන්නේ මේ අන්තිම දවස්වලදී දේව සේවයේ වැදගත්කමයි. අපි ලෝකයට අයත් නොවුනත් අපි ලෝකයේ සිටිය යුතුය. ආලෝකය සහ ලුණු ලෙස සේවය කරමින් ස්වාමීන් වහන්සේගේ ආදර්ශය හා වචනය බෙදා ගනිමින් සිටිය යුතුය. අප අවට සිටින මනුෂ්‍යයන්ගේ සදාකාලය අවදානමට ලක්වී ඇති අතර මෙය ස්වාමීන් වහන්සේ අපට භාරදී ඇති සේවයේ සම්පූර්ණයේම නිරතවීමට කාලයයි. දවස් නපුරු බැවින් ප්‍රස්ථාව තදින් අල්ලා ගත යුතුය. (එපීස 5:16)

තුන්වෙනි ප්‍රධාන තේමාව නම් යාච්ඤා කිරීමේ අවශ්‍යතාවයයි. යාච්ඤාව නොමැති නිසා වේ අවසාන දවස්වලදී අපගේ ජීවිතවලට බලය නැතිව සහ බලපෑවක් ඇති කළ නොහැකිව සිටිති. යාච්ඤා කිරීම තුළින් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ උතුරා ගලා යාම, දෙවියන් වහන්සේගේ ප්‍රේමය, දෙවියන් වහන්සේගේ බලය, දෙවියන් වහන්සේගේ ප්‍රඥාව සහ ධෛර්යය, දැඩි උත්සාහය, නිර්භීතකම ඇතිව සිටීමට හැකිවේ. යාච්ඤා කිරීම සඳහා ධෛර්යය ලබාදීමට දැනීන් වැටෙන කිතුණුවන් යන තේමාවෙන් සහ යාච්ඤාව ඉලක්ක කරගත් තවත් ලිපි මෙම කලාපය තුළ ඇතුළත් කර ඇත. විශේෂයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීමට පෙර සභාව අවදිකිරීමට සහ නැතිවූවන් වෙත ළඟාවීමට පිඹිදීම සඳහා ඇදහිල්ලෙන් යාච්ඤා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව එයින් අවධාරණය කරනු ලබයි.

මෙම කාරණය තුළින් වේ අවසන්ා දවස්වලදී ඔබගේ ජීවිතය සහ සේවය ස්වාමීන් වහන්සේ ගැඹුරින් ස්පර්ශ කරනු ඇතැයි බලාපොරොත්තු වෙමින් යාච්ඤා කරන්නෙමු.

**"අපේ බලාපොරොත්තුවේ ප්‍රකාශ කිරීම වංචල නොවන පිණිස එය තදින් අල්ලාගෙන සිටිමු. මක්නිසාද පොරොන්දුව දුන් තැනැත්තේ විශ්වාසව සිටින සේක. තවද ප්‍රේමයටද යහපත් ක්‍රියාවලට ද පොළඹවන පිණිස එකිනෙකා ගැන සිතේ තබා ගනිමු. සමහරුන්ගේ පුරුද්ද ලෙස අපේම රැස්වීම අත්නොහළ ඒ දවස ළංවන බව නුඹලාට පෙනෙන ප්‍රකාරයට වඩාවඩා එකිනෙකාට අවවාද කරමු. ~** (හෙබ්‍රෙව් 10:23-25)

**"විනාශයට පළමුවෙන් උඩඟුකමද, වැටීමට පළමුවෙන් අහංකාර සිතද වෙයි. " (හිතෝපදේශ 16:18)**

# සභාව සහ ලෝකය

**"එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයායාණන්ගේත් නාමයට ඔවුන් බෞතිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකල සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මම ද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටමියි කී සේක."** (මතෙව් 28:19-20)

සභාව ක්‍රිස්තුස් වහන්සේගේ නියෝජිතයා සහ අඛණ්ඩ පැවැත්මය. **"මම ලෝකයෙහි නවත් නොසිටිමි. ඔවුහු ලෝකයෙහි සිටිති. මම ද ඔබ ළඟට එමි. ශුද්ධ වූ පියාණෙනි, අප ඒකත්වයක්ව සිටින්නාක් මෙන්ම ඔවුන්ද ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් ඔවුන් ඔබගේ නාමයෙන් ආරක්ෂා කළ මැනව."** (යොහාන් 17:11) ක්‍රිස්තුස් වහන්සේගෙන් වෙන්ව සභාවට ආලෝකයක් හෝ ජීවනයක් නැත. උන්වහන්සේගේ අභිමුඛත්වය අප සමඟ නොගියොත් පාළුකරයේ අපගේ වන්දනා ගමන නොකඩවා ඉදිරියට යාමට නොහැකිය. ක්‍රිස්තුස් වහන්සේ සභාව සමඟ සහ සභාව තුළ සිටින සේක. උන්වහන්සේ ස්වර්ගයෙන් බැස එන විට කිසිදාක පියාණන් වහන්සේගෙන් අහක්ව නොගිය සේක. ස්වර්ගයට යාමේදී උන්වහන්සේ කිසි විටෙකත් සභාව හැර නොගිය සේක.

**පියාණන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේව එවනු ලැබූසේම ක්‍රිස්තුස් වහන්සේ සභාව යැවූ සේක. ක්‍රිස්තුස් වහන්සේව එවනු ලැබුවේ පියාණන් වහන්සේව එළිදරව් කිරීමට, උන්වහන්සේගේ නියෝජනයාවීමට, උන්වහන්සේ ගැන සාක්ෂිදීමට, උන්වහන්සේව ප්‍රකාශ කිරීමට , උන්වහන්සේගේ කැමැත්ත කිරීමට සහ කාර්යය අවසන් කිරීමට වූ සේක. යේසුස් වහන්සේ සැබෑ සහ විශ්වාසවන්ත සාකඡිකරුවෙක් වූ සේක. උන්වහන්සේ පරිපූර්ණ සේවකයා වූ අතර පියාණන් වහන්සේගේ කැමැත්ත කිරීම යේසුස් වහන්සේගේ ආහාරය වූ සේක. යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ නාමය ප්‍රකාශ කර කාර්යය සම්පූර්ණ කළ සේක. දැන් ක්‍රිස්තුස් වහන්සේ අපව ලෝකය වෙනට යවන්නේ අපි උන්වහන්සේගේ ජීවිතය පෙන්වීමටත්, අපි උන්වහන්සේගේ සාක්ෂිකරුවන්වීමටත්, උන්වහන්සේගේ ආලෝකය සහ ප්‍රේමය අප තුළින් බැබලීමටත් ආකර්ෂණය කර ගැනීමටත්, අප තුළින් මනුෂ්‍යයන්ට ආශීර්වාද කිරීමටත්, ක්‍රිස්තුස් වහන්සේ තුළ පියාණන් වහන්සේව දකින ලෙස මනුෂ්‍යයන් අප තුළ ක්‍රිස්තුස් වහන්සේව දකින පිණිසත්ය.**

## ලෝකයේ දැක්ම (දර්ශනය)

**ලෝකය තුළ සභාවේ කාර්යයය සහ සභාවට ඇති අනතුර යන දෙකම වතක තබා ගැනීම දුෂ්කරය. එවෙන්ම සභාවේ පළපුරුද්ද සේවයේ සීමාසහිතවීමට නැඹුරු වී තිබෙන බව පෙනෙන්නට ඇත. ආරවුල් නිසා ධෛර්යයත්, ප්‍රේමයෙන් වෙනත් වතයන් ඉවසීමේ හැකියාවත්, (අනිත් අයගේ අදහස්) අනුකම්පාවත් නැතිවී ගොස් මුලා කිරීම කරුණාකොටගෙන වතුපිට සාර්ථකත්වය ඇතිව මේ වර්තමාන ලෝකයට සුදුසු ආකාරයට සභාව හැඩගැසී ඇත. සභාව සංඛ්‍යාත්මකව වැඩි වුවත් ආත්මයාණන් වහන්සේ නැතිව ආත්මිකව මිය ගොස් හෝ අළුත් නොවූ තත්ත්වයකට පත්වී ඇත. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය සභාව තුළ නොවැතිව සිටිති. එක් පැත්තකින් සභාව සහ ලෝකය ප්‍රතිවිරුද්ධව තිබේ. නමුත් එදිරිවාදියෙක් නොවේ. එකක් ස්වභාවික තත්ත්වය වන අතර අනිත් එක ආත්මික තත්ත්වයයි. ලෝකය පළමු ආදම්ගේය. (පාපයට වැටීමට කලින් පවා) ආදම් පොලොවේ පස් වලින් වූයේය. ස්වර්ගයෙන් පැමිණි ස්වාමීන් වහන්සේ වන ආත්මික මනුෂ්‍යයා වූ දෙවන ආදම්ගෙන් සභාව උපත ලැබීය. (1 කොරින්ති 15:47) ප්‍රේමණීය දෙවියන් වහන්සේගේ මැවිල්ලක් ලෙස සලකන විට ලෝකය යහපත්ය. එවෙන්ම එය සභාව උදෙසා සාදා ඇත.**

**නමුත් ලෝකය දෙස බැලිය යුත්තේ වෙනත් ආකාරයකිනි. නමුත් ඒ හා සමාන සත්‍යතාවයක් තුළය. මනුෂ්‍යයා වැටී ඇත. අපි ජීවත්වන්නේ නපුරු ලෝකයක් තුළය. අප ජීවත්වන ලෝකය කොපමණ නපුරුවට තිබෙනවාද කියා අප තුළ තිබෙන ලෝකයේ කාරණා වන ආත්මාර්ථකාමීත්වයෙන්, උඩඟුකමෙන්, තණ්හාවෙන්, ආශාවෙන්, භාභිර දේ කෙරෙහි විශ්වාසය තැබීමෙන්, ආත්මික දේ කෙරෙහි අවිශ්වාසයෙන්, දෙවියන් වහන්සේගෙන් වෙන්ව සිටින නිසා දේව භීතිය හීනව තිබීමෙන් පැහැදිලිව දැනගත හැකිය. සභාව නිරන්තරයෙන් මේ ලෝකයේ කාරණාවලට විරුද්ධව සටන් කළ යුතුය. සභාව නිතැතුරුවම ස්වභාවධර්මය සහ කරුණාව අතරත්, මාංශය සහ ආත්මය අතරත්, අන්න ක්‍රිස්තු සහ ක්‍රිස්තුස් වහන්සේ අතරත්, සාතන් සහ දෙවියන් වහන්සේ අතරත්, පවතින විරුද්ධවාදීකම අවධාරණය කළ යුතුය. ලෝකයේ දෙවියා වන සාතන්ව මේ වන විටත් විනිශ්චය කරුණුකොටගෙන හෙළා දැක ඇති බවත්, දෙවියන් වහන්සේගේ සතුරන් වනට පැමිණීමට නියමිත උන්වහන්සේගේ උදහසත් ප්‍රකාශ කළ යුතුය. මෙයින් ගැළවෙන පිණිස ලෝකයෙන් වෙන්වන ලෙස මනුෂ්‍යයන්ට අනුශාසනා කළ යුතුය. සභාව ඇගේ සාක්ෂිය අපහැදිලිවීමටත්, ඇගේ ජීවිතය සහ ගමන් කිරීම (ක්‍රියාමාර්ග) අලංකාර නොවීමටත්, ඇගේ විනය ගැන නොසැලකිලිමත් වීමටත්, හිසවන ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ සාමාජියන් ලෙස ජීවිතයේ අලුත්වීමකින් නොහැසිරෙන මනුෂ්‍යයන්ගේ දේවලට යොමුවීමටත් ඉඩ නොහැරිය යුතුය.**

**යේසුස් වහන්සේ තුළ තිබෙන සත්‍යතාවය හඳුනා ගැනීමට මේ ලෝකයේ ප්‍රඥාවට හැකියාවක් නොවැත. අපගේ ගැලවුව්කරුවාණන් කලින්ම ප්‍රකාශ කළ පරිදි ලෝකය අපට වෛරකරනු ඇත. අපි ක්‍රිස්තුස් වහන්සේගේ ස්වභාවය වැඩි වැඩියෙන් පෙන්වන තරමට අපි උන්වහන්සේව වඩාත් සම්පව අනුගමනය කරන අතර උන්වහන්සේ වෙනුවෙන් වචනයෙන් සහ සත්‍යයෙන් සාක්ෂි දෙන තරමට සියලු ජාතීන් අතරේ සහ ලෝකයේ සතුරුකම සහ පීඩා අප වත රැඳෙනු ඇත. මක්නිසාද ලෝකය තමන්ගේම දේට ප්‍රේම කරයි. ලෝකයෙන් නොවන ඉහළින් පැමිණෙන දේට වෛර කරයි.**

**අපගේ බලාපොරොත්තුව ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීමයි. අප බලාපොරොත්තු වන්නේ සමාදානයේ සහ හිතැඟි එළිය වෙන් දීප්තිමත් දවස් නොවේ. නුමුත් කුණාටු සහ දැඩි ප්‍රචණ්ඩකාරී දවස් වේ. අපි බලාපොරොත්තු වන්නේ සුරක්ෂිතභාවයේ, දේවභක්තියේ සහ සත්‍යයේ කාලයන් නොව නමුත් අන්තරායකාරී කාලයන්, ලෞකිකත්වය පවතින ශක්තිය නොවැති ආකර්ෂණීය සහ ප්‍රචණ්ඩත්වය පවතින කාලයන්ය. ජලගැල්මට සහ සොදොම ගොමෝරාවේ විනාශයට පෙර දිනය අපි අපේක්ෂා කරන්නෙමු. විනිශ්චය පැමිණෙන විට දෙවියන් වහන්සේ යුදෙව්වන් සහ අන්‍යජාතීන්ගෙන් බොහෝ දෙනෙක් සභාවට එක්රැස් කරන බවත් උන්වහන්සේගේ සාක්ෂිය බොහෝ සමූහයන්ට ආශීර්වාදයක් වන**

(ඇඩොල්ෆ් සෆීර් විසිනි.) (1831 - 1891)

**බවත් අපි විශ්වාස කරන්නෙමු. එම නිසා අපේ බලාපොරොත්තුව පියාණන් වහන්සේගේ කැමැත්තට අනුව රාජ්‍යය තමන් වහන්සේ වෙතට ගෙන ඒමට නැවත පැමිණෙන ස්වාමීන් වහන්සේ මිස අන් කිසිවක් නොවේ.**

## ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශය අනුගමනය කරන්න.

**සභාව ලෝකයෙන් නොකැළැල්ව තබා ගැනීමටත්, කරුණාවෙන් හා ස්වර්ගීය මනසින් වැඩිවීමටත් කැමති නම් ඇය පියාණන් වහන්සේ විසින් එවන ලද නැති වූ දේ සෙවීමට සහ ගලවා ගැනීමට පැමිණි තම ස්වාමියාගේ මනසට ඇතුල් විය යුතුය. උන්වහන්සේ යහපත කරමින් ගොස් එසිරිවරුන්ට සහ සුංගවි අයකරන්නන්ට දිව්‍ය ප්‍රේමය ප්‍රකාශ කළ සේක. වරදකරුවන් වෙනුවෙන් මිය ගිය උන්වහන්සේගේ සීමා නොවූ ආදරයෙන් අනින් අයට උපස්ථාන කිරීමට පැමිණි මහා උපස්ථායකයාණන්ගේ අඩි පාරේ නොයන සහ විනාශ වෙන ආත්ම කෙරෙහි අනුකම්පාවක් නොදක්වන සභාව දැනටමත් ලෞකික වී ඇත. ආත්මාර්ථකාමීත්වයේ සහ අවිශ්වාසයේ ආත්මය දැනටමත් ඇගේ (සභාවේ) හදවතට ඇතුල්වී ඇති අතර එය ඇගේ ජීවිතය අවදානමට ලක් කර ඇත.**

**ඇය (සභාව) පවිත්‍රව සිටීමින් ලෝකය වෙනට ගොස් වචනයෙන් හා ක්‍රියාවෙන් සුභාරංචිය දේශනා කළ යුතුය. ඇගේ ස්වර්ගීය මනඃලායාට ඇගේ පක්ෂපාතිකම් දක්වන විට, ලෝකයෙන් නොකළැල්ව සිටින විට, ආත්මයේ බොහෝ ආශීර්වාද සහ ජයග්‍රහණ ලබාගන්නවා ඇත. සභාව ලෝකය වෙනුවෙන් පරිත්‍යාගශීලී වන විට අපොස්තුළුවරයා ප්‍රකාශ කර තිබෙන නියමය අනුගමනය කළ යුතුය.**

**"ලෝකයට ඇළුම් නොවන්න."** **ස්වර්ගීය බලපෑම නොමැතිව සභාවට එම ස්ථානයේ සිටීමට නුපුළුවන. අපි ලෝකයේ ප්‍රශංසාව සොයන විට සහ ලෝකයේ ආත්මයට යටත් වන විට අපගේ ආලෝකය නැතිවී අපේ ලුණුවල රස නැතිවී යනු ඇත. සාවුල් රජුගේ යුද්ධ ඇඳුම් පැළඳගෙන දාවිත්ට ගෝලයත් සමඟ සටන් කිරීමට නොහැකි විය. දෙවියන් වහන්සේ අපට සැහෙන්නේය. අපගේ ආයුධ ආත්මිකව තිබේ. ක්‍රිස්තුස් වහන්සේ සමඟ මරණයට පත්වී උන්වහන්සේ සමඟ නැවත නැගිටුණා වූ තැනැත්තාට පමණක් ගැලවුව්කරුවාණන්ගේ ජීවිතය සහ ක්‍රියාවන් ඇතිව ගමන් කළ හැකිවේ. ස්වභාවික සහ අළුත් නොවුනා වූ පුද්ගලයාට යේසුස් වහන්සේව අනුගමනය කළ නොහැකිය. නමුත් ගැලවුව්කරුවාණන්ගේ කරුණාව සහ මලවුන්ගෙන් නැගිට්ටා වූ උන්වහන්සේගේ බලය අපි දැනගත් විට අපට උන්වහන්සේගේ ජීවිතයේ කාරණා වැටහෙන අතර ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මයාණන් වහන්සේව ලබාගැනීමෙන් අපට දෙවියන් වහන්සේගේ පුත්‍රයන් ලෙස ජීවත්වීමටත් උන්වහන්සේ වෙන් ගමන් කිරීමටත් හැකිය. උන්වහන්සේව දැන ගැනීම යනු ජීවිතයට හා දේවභක්තියට අදාළ සියලු දේ දැන ගැනීමයි.**

5 පිටුවට

4 පිටුවෙන්

# සභාව සහ ලෝකය...

## ඔබගේ ආලෝකය බැබලෙන්නට ඉඩදෙන්න

ක්‍රිස්තුස් වහන්සේ සියල්ල තුළ සියල්ල වන සේක. ඒ අතරම සෑම කිතුණුවෙක්ම උන්වහන්සේගේ ශරීරයේ සාමාජිකයෙකි. පුද්ගලික ජීවිතයෙන් කැඳවීමෙන්, තමන්ගේ ක්‍රියාවෙන්, තත්ත්වයෙන් (රැකියාවෙන්) තලෙන්ත (දක්ෂතාවලින්) ස්වාමීන් වහන්සේට වගකිව යුතුය. **"නුඹලාගේ ආලෝකය බබලාවා ..."** කියා ආලෝකය වන යේසුස් වහන්සේ කියන සේක. (මතෙව් 5:16) අප සෑම කෙනෙකුටම උන්වහන්සේගේ චරිතයේ සමහර ලක්ෂණ, උන්වහන්සේගේ ආත්මයේ යම් දීමනාවක්, උන්වහන්සේගේ පූර්ණත්වයේ බලය සහ බලපෑම පවතින්නේය. අප සෑම කෙනෙකුවම යම් ස්ථානයක තබා අප වටා තිබෙන අවස්ථා උදෙසා දීමනා පිරිනමනු ලබන සේක. එක් එක් පුද්ගලයාට පුද්ගලිකව සුවිශේෂී ලෙස විශිෂ්ඨ වූ ගෘහ අධිපතියාණන් භාර දුන් දේ සහ කිරීමට පැවරූ දේ වෙන කෙකුට කළ නොහැකිය. අපි අපගේ ආලෝකය බැබලවීමට ඉඩ ලබා දිය යුතු බව මතක තබා ගනිමු. ඒ හා සමානවම පහසු සහ සරල දේ වෙත මනුෂ්‍යයන්ව යොමු කර උන්වහන්සේගේ ප්‍රේමණීය ප්‍රඥාවේ ආශිර්වාදයටත් ඉඩ හරිමු. රහසිගත, අධ්‍යාත්මික සහ හදවතේ මුල් බැසගත් දේ දැකිය හැකි වන්නේ ඇදහිල්ලේ ඇස් වලට පමණි. නමුත් සෑම කෙනෙකුටම ප්‍රේමයේ ප්‍රකාශනය දැකිය හැකිය. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ මනුෂ්‍යයන්ගේ ඇස් අරින තුරු ඔවුනට යේසුස් වහන්සේව නොපෙනෙන බව සත්‍යයකි. නමුත් එක් අර්ථයකින් ඔවුන්ට දැකීමට විනිශ්චය කිරීමට අගේ කිරීමට හැකිය. අපගේ යහපත් ක්‍රියාවන් දැකීමට සහ තේරුම් ගැනීමට ලෝකයාට හැකියාව ඇත. අපගේ ජීවිතවලට සහ හැසිරීමට දෙවියන් වහන්සේගේ බලපෑම ඔවුන්ට හඳුනාගත හැකිය. ඒ අනුව මනුෂ්‍යයන් අපගේ යහපත් ක්‍රියාවන් දැක ස්වර්ගයේ සිටින පියාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස අපගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළවන ලෙස ස්වාමීන් වහන්සේ වන යේසුස් වහන්සේ අපට අණකල බව අපට පෙනී යන්නේය.

---

# නිදැල්ලේ යන හදවත් සඳහා පුනිකාරය

**දෙවියන් වහන්සේ ඉදිරියේ වහත් ලෙස තමන්ව යටත්වීම හදවත නිදැල්ලේ යාම සඳහා පළවු පිළියම බව මම සඳහන් කරමි. ආත්මය වැටී ඇති අයහපතට නිරවුල්ව වුහුණදීමට නිදහසට කාරණයකින් හෝ ආත්මාරක්ෂාවකින් තොරව සම්පූර්ණයෙන්ම තමන්ව යටහත් කරගෙන දෙවියන් වහන්සේට ගෞරව කළ යුතු අතර තමාවම යටත් කරගෙන උන්වහන්සේගේ සත්‍යතාවය ප්‍රකාශ කළ යුතුය. ඕනෑම පසුබැසීමකට පසුතැවිලි වී පාපොච්චාරණාකර යේසුස් වහන්සේ වෙත ආපසු යාමට වරප්‍රසාදය ලැබීම දෙවියන් වහන්සේගෙන් ලද මහත් තෑගෙයකි. නමුත් දෙවියන් වහන්සේ වෙතින් නිදැල්ලේ ඉවත්ව යන ආත්මයක් ඇති අය මෙම දිවිසවය දීමනාව වෙන නැවත හැරී එන්නේ නැත. පසුතැවිලිවීමේ දීමනාව සැබවින්ම දිවිසවය දීමනාවක් වන අතර දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලැබෙන අනුග්‍රහයේ සංඛේතයකි. වරද ඒත්තු ගෙන නැවත හැරී ඒවට අපට එම කරුණාව ලබා ගැනීම අවශ්‍යව තිබේ.**

## දෙවියන් වහන්සේ සමඟ හරිගැස්සෙන්න

**තවත් පිළියමක් නම් ඕනෑම වැයවීමක් කර දෙවියන් වහන්සේ සමඟ සහ මනුෂ්‍යයන් සමඟ නිවැරදිවීමට ස්ථිර අධිෂ්ඨානයයි. අපි විනිශ්චය දවසට යන අතර එදිනදී අපගේ ආත්මය තුළ ධර්මිෂ්ඨකම තිබිය යුතුය. නිවැරදිවීමට ගන්නා වූ මෙම අධිෂ්ඨානය කෙසා දුරුවෙකුගෙන් හෝ මිතුරෙකුගෙන් හෝ අතපසුවීමක් ගැන සමාව අයැදීමක් පමණක් ඇතුළත් වනවා විය හැකිය. එය මහත් වන්දියක් ගෙවීමක් වීමට ද පුළුවන. එසේ නැති නම් ධනය අහිමිවීමක්, ගෞරවය, කීර්තිය, නැවැත්වීමක් ලෙස හඳුන්වන දේ ඇතුළත් විය හැකිය. එයට දරුණු දරිද්‍රතාවය, සිරිගෙට යාම හෝ පිටුවහල් කිරීම ඇතුළත් විය හැකිය. හදවත දහසක් ඉරි තැලීම් වලින් ඉරා දැමිය හැකි ශෝකයෙන් ඇස උණු කළ හැකි දුක් වේදනා එයට ඇතුළත් විය හැකිය. එමෙන්ම අහිමි විය හැකි සියළුම දේ එයට ඇතුළත් වුවත් ඒ සියළු දේ කැපකර දෙවියන් වහන්සේ ඉදිරියේ හරිගැස්සී නිරයේ ගිනිදැල් වලින් බේරීම අසීමිත ලෙස හොඳය.**

**දෙවියන් වහන්සේට සැබවින්ම ආදරය කරන අයව දන්නේ දෙවියන් වහන්සේ පමණි. උන්වහන්සේගේ මැවිල්ල විනිශ්චය කළ හැකි වන්නේ උන්වහන්සේට පමණි. ආත්මයෙන් දෙවියන් වහන්සේගේ සතුට මිස ලෝකයේ වෙන කිසිවක් සොයන්නේ නැතිව, ලෝකයේ කිසිවකට බිය නොවී උන්වහන්සේ ඉදිරියේ වරද පිළිගෙන උන්වහන්සේ සමඟ සම්පූර්ණයෙන් නිවැරදිවීමට ඕනෑම විලයක් ගෙවීමට සතුටින් එකඟ වෙන්න.**

## සැනසීම සඳහා ස්වාමීන් වහන්සේ දෙස බලන්න

**නිවැරදිවීමට මෙම ස්ථාවර අධිෂ්ඨානය තුළ ඊළඟට කළ යුත්තේ සියලු ගැලවීම සහ සැනසීම සඳහා යේසුස් වහන්සේ දෙස නිරන්තරයෙන් බැලීමයි. ආත්මයේ සැනසීම සඳහා කොමපස ආකාරයේ දේවල් මත රැඳී සිටිනවාදැයි කිසි විටෙකත් නොදනී. මැවිල්ලේ දේවලින් ආත්මයේ සැනසිල්ල සෙවීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන විට යේසුස් වහන්සේ තුළ ආත්මයට සැනසීම තිබෙන බව අත්දකිනු ඇත. දෙවියන් වහන්සේගෙන් පමණක් සතුට සොයන ආත්මය ලබා ගැනීමට වචනයෙන් ප්‍රකාශ කළ නොහැකි තරමේ කැප කිරීමක් අවශ්‍ය වේ. යේසුස් වහන්සේගේ අසීමිත ප්‍රේමය සහ දයාව ආත්මයට දැනෙන අවශ්‍යතාවයට ආත්මය දිනෙන් දින පුළුල් වේ**

නිදැල්ලේ ගිය ආත්මයන් නැවත පැමිණෙන්නේ නම් බයිබලයේ ඇති පුදුමාකාර පොරොන්දු දෙවියන් වහන්සේ ලබාදෙන සේක. දෙවියන් වහන්සේ ඒප්‍රායිම්ව අතහරින්නේ කෙසේදැයි අසන සේක. එමෙන්ම දෙවියන් වහන්සේගේ සෙනඟට හැරී එන ලෙස උන්වහන්සේ පවසන සේක. **"ඒප්‍රායිම් මම කෙසේ නුඹ අත්හරින්නෙම්ද ... ?"** (හොෂෙයා 11:8) (යෙරමියා 3:11-15 දක්වාත් කියවන්න) දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් වහන්සේ දෙස පමණක් ආත්මයේ ගැලවීම, පිඹීදීම, සැනසීම සඳහා බැලිය යුතුය. සභාවෙන් ආදරණීයන්ගෙන් ශුද්ධවන්තයන්ගෙන් බොහෝ සැනසීම් දිරිගැන්වීම් සහ උපකාර ලබාගත හැකි නමුත් ආත්මයේ ගැලවීම දෙවියන් වහන්සේගෙන් හැර වෙන කිසිවෙකුගෙන් බලාපොරොත්තු නොවිය යුතුය. සැනසීම සඳහා විශ්වාසදායක එකම මාර්ගය මෙයයි.

## අධෛර්‍යයට එරෙහිවන්න

**තවත් පිළියමක් නම් කිසිවිටෙකත් අධෛර්‍යයට පත් නොවන ස්ථිර අධිෂ්ඨානයකි. කොයිතරම් විශාල නඩු විභාගයක් වුවත් අහස කොපමණ වළාකුළින් බරව තිබුණත් සියලු අධෛර්‍යය කිරීම් ඝාතන්ගෙන් බවත්, එය සැබවිටම භානිකර බවත් අවබෝධ කරගත යුතුය. (ලූක් 18:1)**

ගීතිකාකරුවා පවසන්නේ මෙසේය. **"එව්බා මාගේ ආත්මය, මක්නිසා මලානිකව ඉන්නෙහිද ..? මක්නිසා මා තුළ කැළඹෙන්නෙහිද ..? දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වෙව. මක්නිසාද මාගේ මුහුණේ සැපදායක වූ මාගේ දෙවි වූ උන්වහන්සේට තවම ස්තුති ප්‍රශංසා කරන්නෙමි. "** (ගීතාවලිය 43:5)

**සෑම කිතුණු විරුද්ධවාදීකමකදීම ජයග්‍රහණය සඳහා බලාපොරොත්තුවේ දොරටු විවෘත වේ. ස්වර්ගයේ සිටින විලියන ගණන් ශුද්ධවන්තයන් අප දැන් වුහුණ දෙන බාධා පරීක්ෂා තුළින් ගමන් කරනු ලැබුවෝය. ඔවුන්ගේ ජීවිත වලින් අපට ආදර්ශයක් දී ඇත. එය අපට හරියටම ගැලපේ.**

## පාපය ගැන කණගාටුවීම

**තවත් පිළියමක් වන්නේ පාපය පිළිබඳව නිරන්තරයෙන් ශෝකයෙන් යුතු භැඟීමක් වර්ධනය කර ගැනීමයි. පාපය උදෙසා දුක්වීම දෙආකාරව තිබේ. එකක් මරණය සඳහා දුක්වීම සහ අනිත් කාරණය ජීවනය සඳහා දුක්වීමෙන් වැඩ කිරීමයි. වරදකාරීත්වය, දුෂ්චරිතය, දැඩි කණස්සල්ල සම්පූර්ණයෙන්ම ඉවත් කළ පසු පාපය ගැන ශෝකයක් තිබිය යුතුය. ශුද්ධවන්තයන්ට පීඩා කිරීම ගැන පාවුල්තුමාට නිරන්තරයෙන් ශෝකයක් ඇති විය. එය ඔහුගේ භක්තියට පිටුවහලක් වූවා මිස බාධාවක් නොවීය. (බරක් නොවීය)**

**පාපය ගැන කණගාටු වන විට, පාපය ද්වේශ කිරීම වැඩි වන අතර පාපය යනු කෙබඳු දෙයක් දැයි හෘදය සාක්ෂියේ සංවේදිතවාය වර්ධනයවීම සිදුවේ. අපි දෙවියන් වහන්සේගේ මහිමය දෙස බලන විට අසම්පූර්ණ සහ නුසුදුසු දේ වඩාත් පැහැදිලිව හඳුනා ගැනීමට එය අපේ දැක්ම ශක්තිමත් කරනු ලබයි. පාපය ගැන ශෝකයෙන් සිටීමෙන් ආත්මික ජීවිතයට පය තැබීමට විවේකයක් නොලැබේ. දිවිසවය වේදනාව වර්ධනය වුවත්, යටහත්කම, අදැහිල්ල, කණස්සල්ලට පත්වීමට ඉඩ හරින්නේ නැත. මෙම ශෝකය සහිත ආත්මය දෙවියන් වහන්සේ වෙතට සමීප කරනු ලබයි. බොහෝ සමාව ලබන අය බොහෝ සෙයින් ආදරය කරන බව පැවසූ විට යේසුස් වහන්සේ සඳහන් කළේ මෙසේය. (ලූක් 7:36-50) එවැනි ආත්ම සහිත අය ජීවත්වන්නේ යේසුස් වහන්සේ ලේ උල්පත ළඟය. පාපය උදෙසා වේ ආදරණීය ශෝකවීම බොහෝ ආත්මික අන්තරායන්ගෙන් ආත්මය වුදා හරියි. එය මුළු චරිතයට මෘදු මොළොක් බවක් ඇති කරයි. දෙවියන් වහන්සේගේ ස්පර්ශයට අපව ගැඹුරින් නම්‍යශීලී කරයි. එය අපගේ සියලු හඬ බව ඉවත් කරයි. එය අන් සියල්ලන්ටම අපව ආශිර්වාදයක් කරනු ලබයි. පාපය ගැන නිරන්තරයෙන් ශෝක වන හදවත උණු කරනු ලබයි. ස්වර්ගය සඳහා ජීවත්වීමේ**

6 පිටුවට

5 පිටුවෙන්

# නිදැල්ලේ යන ගදවත් සඳහා...

උනන්දුව වැඩිකර මේ ලෝකයේ අන්තරායන් වලින් විපතක් ඇති නොවන පිණිස ආරක්ෂා කරනු ලබයි.

## වැරදියට සාදා තිබෙන පියගැට පෙළ

තවත් ප්‍රතිකර්මයක් වන්නේ අපගේ සියළු අසාර්ථකත්වයන් කරුණාවේ ඉහළට නැගීම සඳහා අවස්ථාවන් බවට පත්කර ගැනීමට ඇති ස්ථිර අධිෂ්ඨානයයි. එය ප්‍රතිවිරුද්ධව තිබෙන දෙයක් ලෙස පෙණුනද අපගේ වැටීම් අපගේ නැගීම් සඳහා කරුණාවේ පියගැට පෙළක් බවට පත්කර ගත යුතුය. මෙය ජීවිත දහස් ගණනක් තුළ සිදුකර ඇත. පරිහානියට ලක් වූ අය කරුණාවෙන් නැගී සිටිය පසු තමන්ම පූජාවෙමින් අදහිල්ලේ වීරයන් ලෙස සැරසී සිටියෝය. ඔවුන්ගේ අසාර්ථකත්වයන් දෙවියන් වහන්සේට වඩාත් සමීපවීම සඳහා භාවිතා කළෝය. (2 කොරින්ති 7:6-11) සාතන්ගේ සියලු ද්වේශ සහගත තන්ත්වයන් හා අපට හානිකර දේවලින් ජය ගැනීමට හොඳම මාර්ගය මෙයයි. දෙවියන් වහන්සේ ස්වර්ගයේ හෝ පොළොවේ ඇති සියල්ල අපගේ යහපත සඳහා එකට ක්‍රියාකරවීමට හැකිවන්නේ වේ ආකාරයටයි. නමුත් මෙම විශාල ජයග්‍රහණය සම්පූර්ණ පසුතැවිලිවීමේ කොන්දේසිය හරහා බවත් දෙවියන් වහන්සේට ප්‍රේමයෙන් පක්ෂපාතීව හැරෙන විට පමණක් බවත් අපි මතක තබා ගත යුතුය. ශුද්ධාත්මයාණන් වහන්සේ සෑම දෙයක්ම අපගේ යහපතට හරවන සේක. (රෝම 8:28) අපගේ ජීවිතයේ සෑම වරදක්ම සෑම කැළලක්ම ගැන වඩා නිහතමානීවීමට සහ දෙවියන් වහන්සේ සමඟ සමීපව ගමන් කිරීමට අපි අද්විතීය කරගනිමු.

## ජීවිතය වටකරගෙන තිබෙන ආත්මපරිත්‍යාගය

පසුබටවීමට එරෙහිවීම සඳහා තවත් පිළියමක් වන්නේ ආත්ම පරිත්‍යාගයයි. (තමාවම ප්‍රතික්ෂේප කිරීමයි.) සියලු අධ්‍යාත්මික ජයග්‍රහණයේ හරය මෙයයි. ආත්ම තෘප්තිය නොපෙනෙන්නා වූ දහසක් දේ අප මත වර්ධනය වන්නාසේම තමාවම ප්‍රතික්ෂේප කිරීම අප වටා තිබිය යුතුය. නිරාහාරව යාච්ඤා කිරීමේ මූලධර්ම සමඟ සම්බන්ධවීම එතරම් ප්‍රායෝගික නොවේ. නමුත් ශුද්ධ ලියවිල්ලේ සහ ඉතිහාසයේ ශුද්ධවන්තයන්ගේ ආදර්ශය වටින්නේ නම් ඒ බවුන් නිරාහාරව සිටීම තුළ තමන්වම ප්‍රතික්ෂේප කරමින් බවුන් අධ්‍යාත්මික ශක්තියේ ඉහළම මට්ටමට පැමිණි බව පෙනෙන්නට තිබීමයි. මානසික සතුට, සමාජ පහසුව සහ සියලු ලෞකික තෘප්තිය බවුන් ප්‍රතික්ෂේප කළෝය.

දහස් ගණන් කිතුණුවන් ශුද්ධාත්මයාණන් වහන්සේව දුක් කිරීමටත්, බොහෝ භයානක පාපවලට අත්තිවාරම් දැමීමටත්, භාණ්ඩ වැටීම් ඇති කිරීමටත් හැකිවන පරිදි නිරන්තරයෙන් ධනයට වඩා කමින් බොමින්, ධනයට වඩා කථා කරමින් සිටිති. සුඛෝපභෝගී පහසුව සහ තමන්වම සතුටුකර ගැනීම දහස් ගණනක් කිතුණුවන්ගේ ජීවිතවල විෂ බීජ බවට පත්ව තිබේ. ගෙවී ගිය යුගවලදී සියල්ල අතහැර දමන තාපසවරයන් ලෙස අන්තයට ගියෝය. මේ යුගයේ සැබෑ සහ වික්‍රමාන්විත ලෙස ආත්ම පරිත්‍යාගයෙන් යුතුව තමාවම ප්‍රතික්ෂේප කරන අයව සොයා ගැනීම කණගාටුදායක ලෙස දුර්ලභව තිබේ. ප්‍රේතුස් අපට පවසන්නේ අපි ආත්ම පරිත්‍යාගයේ මූලධර්මය සමඟ සන්නද්ධ විය යුතු බවයි. (1 ප්‍රේතුස් 4:1-6) මෙම ආත්ම පරිත්‍යාගයේ මූලධර්මය නම්, අපගේ අවයවයන් භාවිතා කිරීම, අපගේ ඇස්, අපගේ වචන, අපගේ හැසිරීම්, අපගේ සමාජ සබඳතා, අපගේ ඇඟුම් පැළඳුම්, ධනය අංශයකින් ශරීරයට ලබාදෙන සියලුම අනවශ්‍යය තෘප්තිවත් කිරීම් වලින් ආරක්ෂාවීම හෝ අතුළාන්න ආත්මික ශක්තිය තුළ බලවත්ව සිටීමයි. අපගේ ස්වභාවය කෙඳිරිගාමින් සිටින දැඩි වේදනාකාරී (කරදරකාරී) දෙයක් ලෙස තමාවම ප්‍රතික්ෂේප කිරීම දෙස බැලුවොත් එයින් පෙනී යන්නේ අපි අපවම තවම කුරුසියේ ඇණ ගැසීමට අතුළුත් කර නොමැති බවයි. දෙවියන් වහන්සේගේ කරුණාවෙන් යම් යම් කරුණු පසුකරන විට තමාවම ප්‍රතික්ෂේප කිරීමෙන් ස්වභාවික අධික තෘප්තියට වඩා සාමයෙන්, ප්‍රීතියෙන් පිරි ස්වර්ගික ආශ්වාදයක් පැවිසේ. අපි අපවම ප්‍රතික්ෂේප නොකරන විට අපගේ ආත්මික ජීවිතය හිස්වනු ඇත.

## ආත්මිකව කඩිසර වෙන්න

තවත් ආරක්ෂාවක් වන්නේ අධ්‍යාත්මිකව කඩිසරවීමයි. සමහර විට ආත්මික ජීවිතය තුළ අධ්‍යාත්මික අලසකම තරම් විශාල හෝ නිවැරදි කළ නොහැකි නරකක් නැත. එය සාතන් වෙතට ඇදයාම වැනි නපුරකි. එය ජීවිතයේ සෑම අංශයකම පැතිරිය හැකි අතර සියල්ල නිෂ්ක්‍රීය කර ජීවය නොවැනි තත්ත්වයට ඇද දමනු ලබයි. ආත්මික අලසකම කිතුණු ජීවිතයේ විනාශයේ මූලික අවදිය වේ. එය ආත්මික අත්දැකීම්වල වස්තු කාදමන අතර ආත්මික සටන සඳහා අපි ආත්මික ඇඳුම් පැළඳගැනීමට උත්සාහ දරන විට ඒවා කැලිවලට කඩා වැටී ඇති බවත්, උදාසීනත්වයේ කපටි සලඹයා ඒවා කා දමා ඇති බවත් දකින්නෝය.

හේතුවක් නොමැතිව ප්‍රමාද වී නිදා ගැනීමෙන්, උවමනාවට වඩා විවේකීව සිටීමෙන් ගැරහීමෙන්, නිෂ්ඵල සංචාර වලින්, වැදගත්මකට නැති දේවලට කාලය වැය කිරීමෙන් අපගේ ජීවිතවලට කොපමණ කාලයක් අහිමිවී තිබෙනවාද ..? කාලය නිෂ්ඵලයේ ගෙවා දැමීම කොයිතරම් නරකද ? අපි මුළු හදවතින්ම පසුතැවිලි වී මෙම අලසකමේ සතුරාට එරෙහිව ගිණි පුපුරක් මෙන් නැගී සිටිමු. අපි පාන්දරින්ම අවදිවී යාච්ඤාවෙන් ආත්මික පොත්පත් කියවමින්, සෑම ආකාරයකම යහපත් වැඩවල නිරත වෙමු. අපි සෑම දෙයකදීම නිහතමානීව, ධර්මිෂ්ඨව සිටිමින් අලස ලෙස හැසිරීම, නොසැලකිලිමත්කම, අඳුවන කම පරාජය කරමු. ජෝන් වෙස්ලිගේ ආදර්ශපාඨය වූයේ "කිසිවිටෙකත් සේවයක් නැතිව නොසිටින්න. කිසි විටෙකත් සුළු සේවයක් නොකරන්න" යනුයි. ශුද්ධ වූ අල්පෝන්සු පැවසුවේ, "ඔහු දැනුවත්ව කිසි විටෙකත්, එක මොහොතක්වත් නාසිත් නොකරන බවයි. "

යාච්ඤා කිරීමෙන්, කියවීමෙන්, ලිවීමෙන් අපට සෑම මොහොතකම කළ හැකි දෙයක් සොයාගත හැකි. නිශ්චිත අධ්‍යාත්මික අවසානයක් සඳහා කථා කිරීම හෝ භාවනාවේ ආත්මයකින් අපගේ සාමාන්‍යය වැඩ කටයුතුවල යෙදෙමු. බොහෝ දෙනා සිතන්නේ විශිෂ්ඨ අධ්‍යාත්මික උද්‍යෝගී බව ජීවිතයේ වෙහෙස සහනික කරන බවයි. නමුත් එය ඊට ප්‍රතිවිරුද්ධ දෙයයි. සිත සෑම විටම දිව්‍යමය හෝ ප්‍රයෝජනවත් දෙයක යෙදී සිටින විට එය ජීවිතයේ අන් කිසිවකට කළ නොහැකි සන්සුන් හා විහිරි නිශ්ශබ්දතාවයක් ගෙනදෙයි. අප තුළින් ඉක්මන් සහ ආවේගශීලී ස්වභාවය ඉවත්කර දමයි.

## නොපසුබට උත්සාහය

වීර්යය යන පැරණි කාලයේ ගුණය සියලු නොඉවසිලිමත් සින් සුව කිරීමට හොඳ ඔසුවකි. නොපසුබට උත්සාහය ආත්මික ජීවිතයේ කොඳුනාරටිය වන අතර එයින් අනෙක් සියලු ගුණධර්මවලට වර්ධනය ගෙන එනු ලබයි. නොපසුබට උත්සාහය යනු දැඩි අධෛර්යවන්වීම්, පරීක්ෂාවන් සහ තනිකම යන අවස්ථාවලට පිළියම වේ. (ලූක් 18:1)

ඔබගේ අසාර්ථකත්වය කුමක් වුවත් අහසේ සහ පොළොවේ ඇති සියල්ල ඔබට විරුද්ධ බව පෙනුනත්, ඔබගේ දුෂ්කරතා ජයගත නොහැකි බව ඔබට පෙනුණත් (හැඟුණත්) ඔබගේ හොඳම මිත්‍රයන්ගේ ඉවසීම ඔබ කෙරෙන් නැති වී ගොස් තිබුණත්, ශ්‍රේෂ්ඨ ශුද්ධවන්තයන්ගේ කැපවීම් වෙහෙසකාරී තත්ත්වයට පත්වන ලෙස ඔබේ වැටීම් විශාල වී ඇතත් සෑම ගුණයහපත්කමක්ම ඔබේ ආත්මයෙන් පහව ගොස් ඇති බව පෙනෙන්නට තිබුණත් ඔබට නොපසුබට උත්සාහය තිබේ නම් සර්වබලධාරී දෙවියන්වහන්සේ ඔබගේ කැවැත්තේ එකම ආකල්පය මත තමා සදාකාලික ජයග්‍රහණය වෙත ඔබව මෙහෙයවනු ලබනවා ඇත. අප වුහුණ දෙන තත්ත්වය දිනා ගැනීමට තරම් ශක්තිය අපට ලබා දී සෑම විටම අපව ජයග්‍රහණයට ගෙන යනු ලබන සේක.

අනිත් අය දැකීමෙන් බලාපොරොත්තු සුන්කර ගන්නා දේවල් අප වෙනුවෙන් ඉටුකිරීමට දෙවියන් වහන්සේ කැමැත්තෙන් සිටින සේක. මීකා අනාගතවකතෘ සමඟ මෙසේ පැවසූ දස දහස් ගණන් බැතිමතුන් ස්වර්ගයේ සිටිනු ඔබට හමුවනු ඇත.

"මම වනාහී ස්වාමීන් වහන්සේ දෙස බලා සිට මාගේ ගැලවීමේ දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි. මාගේ දෙවියන් වහන්සේ මාගේ වචන අසනවා ඇත. එබිබා මාගේ සැතිරිය මට විරුද්ධව ප්‍රීති නොවන්න. මම වැටුණු විට නැගිටින්නෙමි. මා අඳුරෙහි හිඳින කළ ස්වාමීන් වහන්සේ මට එළියක්ව සිටින සේක. ස්වාමීන් වහන්සේ මගේ විපත්තිය කියා මාගේ විනිශ්චය ඉෂ්ඨකරන තුරු මා උන්වහන්සේට විරුද්ධව පව් කළ බැවින් උන්වහන්සේගේ උදහස ඉවසන්නෙමි. උන්වහන්සේ මා ආලෝකයට පමුණුවනවා ඇත. මම ද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම දකින්නෙමි."
(මීකා 7:7-9) නොපසුබට උත්සාහය යනු කිතුණු ජීවිතයේ ගෝලය කැරකෙන අක්ෂයයි.

## දෙවියන් වහන්සේට නිදහසේ කීකරුකම

දෙවියන් වහන්සේට නිදහසේ කීකරුකම හදවත නිදැල්ලේ යාම වළක්වා ගැනීම සඳහා තවත් පිළියමකි. මන්ද එය සදාචාරාත්මක කාරණාවලට වඩා දැඩි බවක් ඇති කරන බැවිනි. අනෙකුත් කිතුණුවන්ගේ තත්ත්වයන් හෝ අනෙකුත් ශුද්ධවන්තයන්ගේ තත්ත්වය තමන්ද දිගටම පවත්වාගෙන යාමට පමණක් කීකරුවීම නිසා දහස් ගණනක් බවුන්ගේ ආත්මික ස්වභාවය පිරිහීමට ලක්කරගෙන ඇත.

දෙවියන් වහන්සේ කිසි විටෙකත් පුද්ගලයන් දෙදෙනෙකු තුළ ආත්මික ජීවිතයේ අනු පිටපතක් ඇති නොකරන සේක. උන්වහන්සේ සමඟ ගමන් කරන සෑම කෙනෙකුටම වෙනත් ධනෑව පුද්ගලයෙකු මෙන් නොව බහුටම ආවේනික දේවල් කීමට, කිරීමට සහ අත්විඳීමට කැඳවනු ලබන සේක. තම දරුවන්ව බවුන්ගෙන් ගලවා ගැනීමට උන්වහන්සේ පුද්ගලික සහ එකිනෙකාට වෙනස් වූ මහත් උපාය මාර්ග යන්වල නිරතවන සේක. එසේ කරන්නේ බවුන් කීකරුවිය යුතු වන්නේ අනිත් අයට නොව දෙවියන් වහන්සේටවීම තීරණාත්මක සාධකයක් නිසාය.

ක්‍රිස්තියානි උපදේශකත්ව ක්ෂේත්‍රයේ ඇදහිල්ල සහ ප්‍රතිපත්තීන්වල සමානත්වයක් ඇත. එහෙම උනත් මෙම පරාසය තුළ පරිපූර්ණත්වයට පත් වූ සියල්ලන්ම තනි පුද්ගල ගමන් මාර්ගයක් අනුගමනය කළ යුතු බව ශුද්ධාත්මයාණන් වහන්සේ නියමකරන සේක. ලෝකයේ සිටියා වූ කිසියම් ශුද්ධවන්තයෙක් පරිපූර්ණ ලෙස දෙවියන් වහන්සේට කීකරු වූයේ නම් බහුට පොළොවේ වෙන කිසිවෙකු එකඟ නොවන දේ පැවසීමට සහ කිරීමට සිදුවනු ඇත. ඔබ දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන්ම කීකරුවන්නේ නම් ඔබේ හොඳම

7 පිටුවට

6 පිටුවෙන්

# නිදැල්ලේ යන ගදවත් සඳහා...

විතුරන්ගේ විනිශ්චයන්ට හෝ රැව් අරැචිකව්වලට පිටින් සමහර දේවල් කිරීමට ඩබට සිදුවනු ඇත. ආලුහව් ඊසාක්ව පූජා කිරීමට ගිය ආකාරයට එකඟ වෙන කිසිවෙක් පොළොවේ සොයාගත නොහැකිවීමට පුළුවන. යෝසෙප්ගේ පවුලේ අය ඩහුගේ අව්වාරවත් සිහින සමඟ එකඟවූයේ නැත. පාවුල්තුමා ප්‍රේරිතයන් එකොළොස් දෙනාගෙන් උපදෙස් ලබාගත්තා නව්, ඩහු කළ දේවල් කිසිවිටෙකත් ඩහු නොකරනු ඇත. දානියෙල් ප්‍රධානියාගේ උපදෙස් ප්‍රතික්ෂේප කරවින් රජුගේ භෝජන සහ වයින්වලින් මත් නොවී සිටීමට තීරණය කළේය. සව්පූර්ණ කීකරුකම සඳහා සන්සුන් බව වෙනස් නොවන බව සහ බය නැතිකම අවශ්‍ය වේ.

තවන් ඇතුළත්ව තිබෙන විතුරු කණ්ඩායමේ කුඩා හෝ විශාල කාරණා මත එකඟවීමෙන් දෙවියන් වහන්සේට කීකරු නොවීම කරුණුකොටගෙන කී දහසක් දෙනා ඇදහිල්ලෙන් දුර්වලව සිටිනවා ..? ආකාශයේ පක්ෂීන් සඳහා මාවතක්ද, පොළොවේ සියලු ජල ධාරාවන් සඳහා මාර්ගයක් ද සාදන දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෑම දරුවෙකුටම කීකරුකමේ රේඛාව නියම කළ සේක. අපි සීමා රහිතව නිහතමානීව නොපසුබට යාච්ඤා කිරීමට යටත් වුවහොත් සහ ශුද්ධාත්මයාණන් වහන්සේට සව්පූර්ණයෙන්ම ඉඩ හැරියහොත් උන්වහන්සේ අපව උන්වහන්සේගේ රේඛාව මත ගෙනයන අතර අපට ලබාදෙන මාර්ගයේ වෙනත් කෙනෙකුව ගෙනයන්නේ නැත.

කීකරුකමෙන් ස්වාදීන වූ විට (කීකරුකම නැති වූ විට) දහස් ගණන් දෙනාගේ දේවබලය වළක්වනු (අහිමි වනු) ලබන්නෝය. කීකරුකමේ මුලාවී වම අන්තයකට ගමන් කරන්නේ නැඟෙ කියා වම දැනගන්නේ කොහොමදැයි යව් කෙනෙක් ඇසිය හැකිය. ඩිනෑව ක්‍රියාපටිපාටියකදී කීකරුවෙන්නේ නව් අනින් අයට අසූර්ව කෙනෙක්ව, යටහත් ආත්මයක් ඇතිව, මෘදු මොළොක් ප්‍රේමය ගලායන්නා වූ, තමාව නොව දෙවියන් වහන්සේව සතුටු කිරීමට යොමු වුනා වූ, දෙවියන් වහන්සේගේ කරුණාව අනින් අය වෙතට ගලායාමට සලස්වන්නා වූ කෙනෙක් බවට පත් වේ. වක්නිසාද දෙවියන් වහන්සේ ඩබව වෙහෙයවන බව ඩබ දැන සිටින්නෝය.

නමුත් ඩිනෑව පුද්ගලයෙකු වත ඩබට ආවේගශීලී, රළු, ඉක්මන්, නුසුදුසු ආකල්පයක් දැනෙන්නේ නව් ඩබ කඩිමුඩියේ ක්‍රියාකරන අනින් අයව හෙළා දකින අනින් අයට බලකරන යවක් ඩබට දැනෙනවා නව් සාතන් ඩබව වෙහෙයවන බව ඩබට දැනගත හැකිය.

යටහත්, මෘදු මොලොක්, පරාර්ථකාමී ආත්මයක් ඇතිව දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ වචනයේ ඇති අධික ප්‍රේමය සහ තමාට මෙන් තමාගේ අසල්වැසියාට ප්‍රේමකරන තත්ත්වයේ පවතින තුරු ඩිනෑවට වඩා ස්වාධීනවී දේවභය අභිවිකරගත නොහැකිය. (මතෙව් 22:36-40 )

## අපගේ සිතුවිලි නිර්මාණශීලී වේ.

දුර්වලතා සඳහා තවත් පිළියමක් ලෙස සහ කීකරුකම ලෙලදීමට වම සඳහන් කරන්නේ මනස දෙවියන් වහ්නසේ සහ උන්වහන්සේගේ රාජ්‍යයේ දේවල් කෙරෙහි රඳවා තබාගන්න (යෙසායා 26:3-4), ගීතාවලිය 1:1-6) ආත්මික ජීවිතය ආරක්ෂා කරගෙන, නපුරු දේවල් වලක්වා ගැනීමට සින දිව්‍යවයකාරණා මත තබා ගැනීමට වඩා වෙනත් දෙයක් තිබිය නොහැකිය. බුද්ධියෙන් හෝ තමන්ගෙ 'ම බලයෙන් මෙය කළ නොහැකිය. නුමුත් ආත්මික ස්වාභාවය ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ තිබේ නම් ආත්මයේ ඇතුළාන්තයට බුද්ධිය එකතු වන අතර, එය නිරතුරුවම දෙවියන් වහ්නසේ වත හෝ උන්වහන්සේගේ ගුණාංග වත, උන්වහන්සේගේ කරුණාවේ ක්‍රියාකිරීම වත, උන්වහන්සේගේ ආරක්ෂාව පිළිබඳ අබිරහස් වත හෝ උන්වහන්සේගේ වචනයේ එළිදරව් කිරීම් වත තබාගත හැකිය.

සිතුවිලි පවිකාරව නිදැල්ලේ යාම තරම් භයානක දෙයක් තවත් නැත. සියලුම භාණිර පාපයන් මුලින්ම සිදුවන්නේ මනස තුළය. ඒ නිසා අනක් අතට කරුණාවේ සියලු විශාලවීම් (වර්ධනයවීම්) භක්තියේ සියලු ආකල්ප, අත්දැකීම් තුළ වර්ධනයවීම ප්‍රථමයෙන් සිදුවන්නේ මනසේ ආත්මික සිතුවිලි තුළය. අපගේ සිතුවිලි නිර්මාණශීලීය. එබැවින් දෙවියන් වහන්සේගේ රාජ්‍යය තුළ අපගේ සැබෑ වාසස්ථානය සොයා ගන්නා වූ කරුණාවේ දීප්තිමත් බලකොටු නිරමාණය කරනු ලබයි. අතීතය ගැන ඩිනෑවට වඩා නොසිතා සිටීමට අපි සැලකිලිමත් විය යුතුය. අතීතයේ ඇති එකම යහපත් සිතුවිල්ල නව් අපගේ පාපිෂ්ඨ බව සහ ස්වාමීන් වහන්සේගේ අනිමහත් කරුණාව ගැන ස්තුති කරවින් යටහත්කම තුළ සේවය කිරීම වන්නේය.

නමුත් ආත්මයේ පූර්ණත්වය තුළ අතීතය ගැන කළකිරීමට පත්වන ආකාරයෙන් එහි අහිවිවීම් ගැන හෝ පටලැවී සිටින ආකාරයන් ගැන නොසිතිය යුතුය. කුරුල්ලෙකු හිස් සහ අබලන් තත්ත්වයේ ඇති තම පසුගිය වසරේ කූඩුව ගැන නොසිතා එයින් ඇත්ව පියාසර කරන්නාක් මෙන් අපි අතීතයේ දේවලින් වෙන්ව සිටිය යුතුය. වක්නිසාද වර්තමාන මුළු ශිව්භාන ස්වභාවයම මහිමයෙන් පිරී තිබේ. (පිලිප්පි 3:1-14) දෙවියන් වහන්සේගේ දේවල් කෙරෙහි සින තබා ගැනීමේ ස්ථාවර පුරුද්දක් අපි ඇතිකර ගත යුතුය. අපි ක්‍රිස්තුස් වහන්සේව අපගේ කල්පනාවේ තබාගත යුතුය. අපි උන්වහන්සේගේ චරිත ලක්ෂණ ගැන සිතා බැලිය යුතුය. ස්වර්ගීය පියාණන් වහන්සේට සහ ශුද්ධාත්මයාණන් වහන්සේට සම්බන්ධව සිටිමින් දෙවියන් වහන්සේ දැන් අප වෙනුවෙන් කරන දේ ගැන සිතිය යුතුය. ස්වර්ග යේ සිටින ශුද්ධවන්තයන් සහ දේවදූතයන් ගැන සිතන්න. අප සමඟ තිබෙන දිව්‍යමය අභිබුබන්වය ගැන සිතන්න. (මතෙව් 28:18-20, යොහාන් 14:15-17, ක්‍රියා 17:24-28)

අපි යේසුස් වහන්සේගේ නැවත පැමිණීම ගැනත්, උන්වහන්සේගේ සහශ්‍රවර්ෂ රාජ්‍යයේ දේවල් ගැනත් සිතිය යුතුය. අනාගතයේ දී උරුමවන ස්වර්ගීය දේවල් ගැනත්, ජීවිතයට ලැබෙන්නට යන්නා වූ අස්වභාවික ආශිර්වාද ගැනත් සිතිය යුතුය. ගැඹුරු දිව්‍යමය කල්පනාවල පැවතීමේ පුරුද්ද අපගේ ජීවිතවලට පුදුමාකාර බලපෑමක් ඇතිකරනු ලබයි. එය අපගේ වචනවල, හැසිරීම්වල ස්වභාවය මහත්මා ගතියෙන් ඇතිකරනු ලබයි. එය ඝෝෂාකාරී, තද, නොඉවසිලිමත් සෑම දෙයක්ම මැඩපවත්වනු ලබයි. එය අපගේ අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬට විවෘත කරනු ලබයි. එය දවසේ ඩිනෑව වෙලාවක යාච්ඤා කිරීම පහසු කරනු ඇත. එය ලෝකයේ දකින්ට තිබෙන හා සංවේදී දේවලින් අපව ඇත්කරනු ලබයි. එය දෙවියන් වහන්සේ සහ ස්වර්ගීය කාරණා අපට දීප්තිමත් යථාර්තයක් බවට පත්කරනු ඇත. එය අපගේ ලක්ෂණවල සන්සුන් බවක්, අපගේ ප්‍රකාශනවල විහිරි බවක් සහ ආත්මයේ ක්‍රියාවන්හි සියුම් ඔපදැවීමක් ලබාදෙනු ඇත. අපගේ සිතුවිලි අපගේ ජීවිතය යටතට ගනු ලබයි. එව නිසා අපගේ මනස ස්වර්ගීය දේවල් කෙරෙහි රඳවා තබාගනිමු. අපි සෑම රාත්‍රියකම දෙවියන් වහන්සේ ගැන සිතමින් නින්දට යමු. එවිට සෑම උදෑසනකම අවදිවන්නේ දෙවියන් වහන්සේ පිළිබඳ සිතුවිල්ල සිතේ තබාගෙන වේ. මෙය ඉටු කිරීමට හැකි අතර නපුරු සිතුවිලි සිතට ඇතුල්වීමෙන් ආරක්ෂා කරනු ලබයි. මන්ද මෙම ස්වභාවයට වඩා කඩිසරව සිටින අයට පවා දවස්පතා සෝදිසි කිරීම් වලින් සාතන් නපුරු යෝජනා ගෙන එන්නෝය. අපෝස්තුළුවරයා මෙලෙස පවසන්නේය.

"වක්නිසාද අපි මාංසයෙහි හැසිරෙන නමුත් මාංශයේ හැටියට යුද්ධ නොකරමුව. (වක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය. එහෙත් ඒවා බලකොටු බිඳ හෙළීමට දෙවියන් වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය.) අපි විවාදයන් ද දෙවියන් වහන්සේ ගැන දැන ගැනීමට විරුද්ධව උසස්වන්නාවූ සියළු උසස් දේවල් ද බිඳහෙළා සියලු සිතුවිලි ක්‍රිස්තුස් වහන්සේට කීකරුවීමට වාල් කර දෙවුව." (2 කොරින්ති 10 : 3-5)

## ආශිර්වාදලත් ඖෂධය .... උපකාරකයාණෝ සමීපයේ සිටින සේක

සියළු පිළියම්වල උච්චතම අවස්ථාව වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවය වර්ධනය කර ගැනීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ඩබගේ ජීවිතයේ සියලු ලෞකික (තාවකාලික) සමාජීය, ආත්මික කටයුතු භාරව සිටින බව අවබෝධ කරගන්න. යේසුස් වහන්සේ ඩබ සමඟ දෘෂ්‍යමානව සිටින්නාක් මෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ හැසිරෙන්න. උන්වහන්සේ සමඟ කථා කරන්න. උන්වහන්සේට ආදරය ප්‍රකාශ කරන්න. ඩබගේ ජීවිතයේ ලොකු කුඩා සියල්ලේදී උන්වහන්සේ සමඟ නිරන්තර සම්බන්ධතාවය පවත්වා ගනිමින් උන්වහන්සේව ඩබගේ මිත්‍රයා කරගන්න. පියාණන් වහන්සේව සහ පුත්‍රයාණන් වහන්සේව ඩබට එළිදරව් කරන ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න. සෑම යුතුකමක්ම (කාර්යයක්ම) ඩබට පෙන්වීමට සහ ඉදිරියේ ඇති දේවල් ඩබට එළිදරව් කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. (යොහාන් 16:13-14) උන්වහන්සේව ඩබේ සමීප මිතුරා කරගන්න. උන්වහන්සේගේ හඬට සවන් දෙන්න. දවස්පතා දෙවියන් වහන්සේගේ කැමැත්ත ගැන ශුද්ධාත්මයාණන් වහන්සේ ඩබව විශ්වයට පත්කරනු ඇති බව බලාපොරොත්තු වෙන්න.

ඩබගේ හදවතේ තබා ඇති උන්වහන්සේගේ මෘදු මොළොක් හැඟීම්වලට වහාම සහ ප්‍රශ්න කිරීමකින් තොරව කීකරුවීමේ පුරුද්දක් අතිකරගන්න. ශුද්ධාත්මයාණන් වහන්සේව ඩබ පිහිනා යන්නා වූ නොපෙනෙන සාගරයේ පවිත්‍ර ආලෝකය බවට පත්කරගන්න. ඩබගේ දුක, කඳුළු, ඩබගේ සියලු දුර්වලතා, සියලු ස්වභාවයන් උන්වහන්සේගේ බලය මත තබන්න. සෑමවිටම උන්වහන්සේ සමඟ ගැඹුරු ශක්තිමත් එකඟතාකමකට ආශා කරන්න. සදාකාලික කාරණා තුළ වර්ධනයවීම පමණක් පිරිහීම සහ හදවත නිදැල්ලේයාව වළක්වා ගැනීමට උපකාර වන බව මතක තබා ගන්න.

මනුෂ්‍යයන්ගේ අත්පොළොසන් නාදවලට වඩා ශුද්ධාත්මයාණන් වහන්සේගේ එක් ස්පර්ශයක් හෝ අවවාදයක් අගේකොට සලකන්න. උන්වහන්සේ ඩබගේ සිතට කථා කරන සෑම නිවැරදි කිරීමක් සහ අවවාදයක් පිළිගන්න. අන් අයගේ ප්‍රශංසාවලට වඩා උන්වහන්සේගේ තරවටුවලට අසීමිත ලෙස ප්‍රේමකරන්න. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවනය ලබාදීම ශුද්ධාත්මයාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨතම කාර්යය බව මතක තබාගන්න. අපි ඒවා ස්ථිරව බලාපොරොත්තු වෙනවා නම් උන්වහන්සේ පුදුම දේ කරනු ලබන සේක.

අපගේ පියාණන් වන දෙවියන් වහන්සේගේ ප්‍රේමය ද අපගේ ස්වාමීන් වන යේසුස් වහන්සේගේ කරුණාවද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ එකඟතාකමද ඩබ සැමදෙනා සමඟ වේවා.....! ආමේන් .... !

**"ඔබගේ ක්‍රියාව ඔබගේ මෙහෙකරුවන්ටත්, ඔබගේ තේජස ඔවුන්ගේ දරුවන් කෙරෙහිත් පෙනේවා " (ගීතාවලිය 90:16)**

Reg. No: Dop/News/36/2024
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



# හදවත නිදැල්ලේ යාමට හේතු .....

**"එහෙයින් තමා කෙලින් සිටින්නේ යයි සිතන තැනැත්තේ නොවැටෙන්ට බලාගනීවා"** (1 කොරින්ති 10:12)

**එබැවින් ඒ සිදුවන සියල්ලෙන් ජයගෙන ගැළවෙන පිණිසද මනුෂ්‍යය පුත්‍රයා ඉදිරියෙහි සිටින පිණිසද කන්නලව් කරමින්, සෑම කාලයේදීම අවදිව හිඳිල්ලා යයි කී සේක.** (ලූක් 21:36)

## අදාශ්‍යමාන (සියුම් ආරම්භයන්)

හදවත දෙවියන් වහන්සේගෙන් ඈතට නිදැල්ලේ යාම මුලදී බොහෝ දුරට පෙනේනේ නැත. කරුණාව හිමිහිට කාන්දුවෙමින් පවතියි. පරීක්ෂාවෙහි බොහෝ දුරට අදෘශ්‍යමාන ආක්‍රමණ පවතියි. සාතන් වෙවැනි සූක්ෂම සහ නිශ්ශබ්ද ක්‍රමවලින් අනාරක්ෂිත මාර්ග හරහා ස්වර්ගීය වස්තු පැළඳගන්නාක් වෙන් උපකල්පනය කිරීමට පොළඹවා ගනිමින් ආත්මය දැන ගැනීමට පෙර ගොදුරු කරගනු ලබයි.

ස්වල්ප වශයෙන් ආත්මික අලසකම සහ ආත්ම පරිත්‍යාගයෙන් කටයුතු කිරීම පහළ මට්ටමක පැවතීම අළුපාට හිසකෙස් වැනිය. එහෙන් වෙහෙන් පැසුණු හිසකෙස් ඇති එය නොදැන සිටි කෙනෙක් ගැන බයිබලයේ කථාකරනු ලබයි. (හොෂයා 7:9)

## තහනම් සහ නීති විරෝධී

දෙවියන් වහන්සේ වෙතින් බොහෝ දුරට නිදැල්ලේ ඇතට යාම ආරම්භ වන්නේ තහනම් වස්තූන් දෙස බැලීමෙනි. පරීක්ෂාවට ලක්වෙන වස්තූන් දෙස බොහෝ වේලා බලාසිටීමට ඇස්වලට ආශාවක් ඇතිවේ. ඇස හරහා සිතුවිලි වලින් එම තහනම් වස්තුව ග්‍රහණය කර ගනියි. එයින් අතිශෝක්තියෙන් සහ නීති විරෝධී ආශාවන් අවුස්සයි. වෙය කැවෙත්ත යටපත් කරන අතර ප්‍රතිඵලය අනුවැඩි වශයෙන් පාපයයි. තහනම් ගහේ ගෙඩි දෙස බලා සිටි ඒවගේ සිද්ධියද එවැන්නකි. මාළිගාවේ සඳළුතලයේ සිට බලා සිටි දාවිත්ගේ සිද්ධිය ද එවැන්නකි. සාතන් යේසුස් වහන්සේ කෙරෙහි අත්හදා බැලූ පරීක්ෂාවද වෙයයි. සාතන් ඩහුගේ දර්ශනය ක්‍රියාත්මක කරමින් මුළු පොළොවේ තේජස සහ ස්වෛරීත්වය පෙන්වන විට යේසුස් වහන්සේ එම දර්ශනයෙන් ක්ෂණිකව දැස් ඉවතට ගෙන පැවිණෙන්නා වූ කුරුසිය මත තැබූ සේක. සිත් ඇදගන්නා වූ සුළු සහ පොළඹන සුළු දර්ශනවලදී ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ වූ ලේ මනසට ලබා ගැනීම හොඳම ප්‍රතිකාරයයි. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බැලීම අපවිත්‍ර කල්පනාවලින් විඳීමට හොඳම ඖෂධයයි.

## අනිසි නිදහස.....

කරුණාව අහිමිවීමට තවත් හේතුවක් වන්නේ අහිංසක දේ සමඟ අනිසි නිදහසක් ලබා ගැනීමයි. ස්වභාවික සහ අහිංසක අපගේ භූමික ජීවිතයෙන් වෙන් කළ නොහැකි බොහෝ දේ ඇත. නමුත් ඒවා අනවශ්‍ය නිදහසක් ලබාගන්නේ නම් ඒවා අභක්තර හා බොහෝ විට භාහිර පාපයට පියවරක් බවට පත්වේ. විශේෂයෙන්ම සමාජය ජීවිතය තුළ මෙය සත්‍යයකි. අප සමාජය තුළ මිශ්‍ර විය යුතු අතර අපගේ පුද්ගලික මිත්‍රත්වයන්, වනසේ ආකර්ෂණයන් පුද්ගලික හැසිරීම්, ස්වභාවික ව්‍යවස්ථාවේ කොටස් වේ. නමුත් මෙම පුද්ගලික ආකර්ෂණයන් ඔස්සේ සියලු අනවශ්‍ය හුරුපුරුදුවලට එරෙහිව සහ මිත්‍රශීලී හැඟීම්වලට එරෙහිව ප්‍රවේශවීමට දැඩි අධිෂ්ඨානයක් තිබිය යුතුය.

## ආත්ම විශ්වාසය

පසුබැසීමට තවත් හේතුවක් වන්නේ ආත්ම විශ්වාසය හෝ සහජයෙන්ම හෝ අත්පත්කරගත් ශක්තිය වත රදා සිටීමයි. දෙවියන් වහන්සේ ගැන අනිශයින් උනන්දුවට පත්ව සිටින හෝ ප්‍රබල ස්වභාවික ගති ලක්ෂණ සහිත ආත්මය ඇති අය ආත්මය දවනය කරගන්නා තෙක් පහසුවෙන්ම ඒ වත රැඳී සිටිති. තමාගේ චරිතයේ සහජ උදාරත්වය පිළිබඳව දැඩි විශ්වාසයක් තිබූ පේතෘස්ගේ තත්ත්වය වෙයයි. අනිත් සියල්ලන්ම යේසුස් වහන්සේව අත්හැර ගියත් තමන් කිසිදාක උන්වහන්සේ අත් නොහරින බවට පේතෘස් පොරොන්දු විය.

අළුතින් ගැලවීම වෙනට පැවිණෙන්නා වූ අය ඩවුන්ගේ පළමු ප්‍රේමයේදී තමන්ගේ අදහිල්ල පිළිබඳව අතිවිශේෂ සහනික කිරීමක් කරනු ලබන අතර බොහෝ විට පළමු ස්වභාවයේ දීප්තියෙන් විනිස් වනස තරමක් ශක්තිමත් වනු ඇත. අප සම්පූර්ණයෙන්ම ශූන්‍යව සිටීමේ යතාර්ථයට බොහෝ දේ ඉගෙන ගැනීමට අවශ්‍යව තිබේ. ආත්ම විශ්වාසයට බොහෝ ස්වභාවයන් තිබේ. එම ස්වභාවය මනුෂ්‍යයාගේ ජීවිතවල සෑම අංශයකටම අදාළ වී තිබේ. කිතුණුවන් නොදැනුවත්වම ඩවුන්ගේ අත්දැකීම් විශ්වාස කරති. ඒ වෙනුවට කළයුත්තේ ශුද්ධාත්මයාණන් වහන්සේ වත පවණක් රැඳී සිටීමයි.

දෙවියන් වහන්සේ යුදෙව්වරුන්ට අනතුරු ඇඟවූයේ ඩවුන් කානාන් දේශයට ඇතුල්වී ආහාර අනුභව කර තෘප්තියට පැවිණී විට උන්වහන්සේව අමතක නොකරන ලෙසය. (ද්විතිය කථාව 8:10-11) ඩවුන් සම්පූර්ණයෙන්ම නැඹුරු වූයේ දුර්වල මනසක් වෙතය. ඩවුන් ශක්තිමත්ව සවිලවෙමින් වතක තබාගත යුතුව තිබුණු දේ අත්හැරියෝය. වෙය අපට අපගේ කානාන් හි අත්දැකීම වත රැඳී නොසිටීමට යොමු කරවනු ලබයි. අපි එසේ කරන්නේ නම් අපගේ කානාන් හි අත්දැකීම අහිමිවී යන්නේය. ආත්මයේ සුදු පැහැය හිම පියල්ලක් වැනිය. ඩබ එය වත හේන්තු වුවහොත් එය දියවේ. අපට කරුණාව, ශක්තිය, ප්‍රඥාව හෝ යම් සාර්ථකත්වයක් ලබා දී ඇති නිසා දිගටම ඒවා පවතිනු ඇතැයි සහනික නොවේ. එසේ සිදුවීමට නම් අපි එය ලබාදෙන්නා වූ මූලාශ්‍රය වත රැඳී සිටිය යුතුය.

## යහපත් ජීවිතයක්

පසුබටවීමට තවත් හේතුවක් වන්නේ යහපත් ජීවිතයක් ලෙස හඳුන්වන දෙයයි. වර්තමානයේ පවතින ඇවරිකාවට වඩා සුඛෝපභෝගී ජීවිතයක් ගත කළ යුගයක් කිසිදාක නොතිබුණි. සාමාන්‍ය ජනයාට ඩවුන්ගේ නිවෙස්වල ගෘහ භාණ්ඩ, ඇඳුම් පැළඳුම්, ආහාරපාන සහ සුවපහසුව වෙනත් යුගවල රජවරුන්ටත් තිබුණේ නැත. මෙම සුඛෝපභෝගී ජීවන රටාව කරුණාව ලැබීමට විශාල බාධාවකි. බොහෝ අවස්ථාවලදී එම කරුණාව අහිමිවී යන්නේ මුනුෂ්‍යයාගේ හදවත ඉතා පහසුවෙන් සුඛෝපභෝගී සහ සැප පහසු දේවලට සම්බන්ධ වන බැවිනි. විශාල රාත්‍රී භෝජන සංග්‍රහ, සිනිදු ගෘහභාණ්ඩ, අලංකාර ඇඳුම් පැළඳුම්, ශ්‍රම ඉතිරි කිරීමේ සැලසුම්, විල අධික මෝටර් රථ, සතුටට හේතුවන සහ පහසුවෙන්ම සංවේදී වන සෑම දෙයකටම ආශාවීම

(ජෝර්ජ් ජී. වොරිසන් විසිනි.) (1845-1923)

දස දහස් ගණනකගේ විනාශයට හේතු වී ඇත. වේ දවස්වලදී දුෂ්කරතාවයන් ඉවසා දරා සිටින, චාම්, නූතන ජීවිතයේ සැප පහසුව ගැන සැලකිල්ලක් නොදක්වන වීර කිතුණුවන් සොයා ගැනීමට හැකි වන්නේ කලාතුරකිනි. යේසුස් වහන්සේ වේ දේවලට විරුද්ධව අනතුරු ඇඟවූ සේක.

එහෙත් ඒ දවස වලපතක් වෙන් හදිස්සියෙන් නුඹලා කෙරේ නොපැවිණෙන පිණිස අධික කැවේද, බීමත්කමින්ද වේ ජීවිතයේ වෙහෙසින්ද, නුඹලාගේ සිත් බර නොවන හැටියට බලාගනිල්ලා. එක්නිසාද ඒක වුළු පොළොතලය පිට වසන්නා වූ සියල්ලන් කෙරෙහි එසේ පැවිණෙන්නේය. එබැවින් ඒ සිදුවන සිල්ලෙන් ජයගෙන ගැලවෙන පිණිසද මනුෂ්‍යය පුත්‍රයා ඉදිරියෙහි සිටින පිණිසද, කන්නලව් කරමින් සෑම කාලයේදීම අවදිව හිඳිල්ලා යයි කී සේක."

(ලූක් 21:34-36 ) උන්වහන්සේගේ නැවත පැමිණීම ඉතා සමීපව තිබෙන අතර සභාව සුඛෝපභෝගී ජීවිතයක ගිලී සිටීම තුළ මෙම අනාගතවාක්‍යය සම්පූර්ණ වී තිබේ.

**ඉතිරි කොටස ඊලඟ කලාපයෙන්**

## වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම වේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.